# <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේදී ය.</u>

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 සහ 126 වන ව්‍යවස්ථා ප්‍රකාරව යාචිත අයදුම්පතක් සම්බන්ධවයි.*

**ආචාර්ය අජිත් සී. එස්. පෙරේරා**
ප්‍රධාන විදායක/ ප්‍රධාන ලේකම්, "ඉදිරිය", අංක 18/1, ආතර් පෙදෙස. දෙහිවල

**<u>පෙත්සම්කරු</u>**

ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් පෙත්සම් අංක 273/2018

(SC FR Application No. 273/2018)

**එදිරිව**

**1.** **ගරු දයා ගමගේ මහතා**
සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍ය සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ජාතිකසභාවේ සභාපති,
80/5, ගොවිජන මන්දිරය, රජමල්වත්ත මාවත, බත්තරමුල්ල.

**2.** **ගරු ෆයිසර් මුස්තාෆා මහතා**
පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍ය
අංක 330, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02.

**3.** **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය, දෙවන මහල, සෙත්සිරිපාය ,බත්තරමුල්ල.

**4.** **ගරු පාටලී චම්පික රණවක මහතා**
මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය, 17ත්වන සහ 18 වන මහල්,සුහුරුපාය, සුබූතිපුර, බත්තරමුල්ල.

**5.** **ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
අධ්‍යාපන අමාත්‍ය, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල.

**6.** **ගරු තලතා අතුකෝරාල මහත්මිය**
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12.

**7.** **ශ්‍රී ලංකා සන්චාරක සංවර්ධන මණ්ඩලය**
අංක 80, ගාලු පාර, කොළඹ 3.

**8.** **නාගරික සංවර්ධන අදිකාරිය**
6වෙනි සහ 7 වන මහල්, සෙත්සිරිපාය. බත්තරමුල්ල.

**9.** **ගරු නීතිපතිවරයා**
නීතිපති දෙපාර්තමේන්තුව, කොළඹ 12.

<u>වගඋත්තරකරුවන්</u>

| | | |
|---|---|---|
| **ඉදිරිපිට දී** | **:** | ජනාධිපති නීතිඥ, විනිසුරු, ප්‍රසන්න ජයවර්ධන<br>ජනාධිපති නීතිඥ, විනිසුරු වී.කේ. මලල්ගොඩ<br>ජනාධිපති නීතිඥ, විනිසුරු මුර්දු එන්.බී. ප්‍රනාන්දු |
| **නීතිඥවරුන්** | **:** | පෙත්සම්කරු තමා වෙනුවෙන් පෙනී සිටි අතර 8 සහ 9 වගඋත්තරකරුවන් වෙනුවෙන්<br>රජයේ ජ්‍යේශ්ඨ අධි නීතිඥ රජිත පෙරේරා මහතා පෙනී සිටියේ ය. |
| **වාචික දේශන** | **:** | 2018 නොවැම්බර් 29 |
| **ලිඛිත දේශන ගොනු කරනු ලැබීම** | **:** | පෙත්සම්කරු විසින් 2018 දෙසැම්බර් මස 11වැනිදා සිදුවිනි. |
| **තීන්දුව ප්‍රකාශ කිරිම** | **:** | 2019 අප්‍රේල් මස 18 දින සිදුවිනි. |

ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ජනාධිපති නීතිඥ ප්‍රසන්න ජයවර්ධන,

**උක්ත අයදුම්පතට බලපෑ පසුබිම**

පෙත්සම්කරු 1975 දී කොළඹ විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී (ගෞරව) උපාධියක් ලබා ඇත. අනතුරුව ඔහු විසින් සිය විද්‍යාපති උපාධිය හදාරනලද අතර ඔහුට එම උපාධිය ප්‍රදානය කරන ලදි. පසුව ඔහු වරලත් රසායනඥයෙකු ලෙස සුදුසුකම් ලැබුවේ ය. ඔහු ශ්‍රී ලංකා වරලත් රසායනඥයන්ගේ ආයතනයේ හා ලන්ඩන් රාජකීය රසායනඥයන්ගේ ආයතනයේ සාමාජිකයෙකි. ඔහුට ගෞරව ආචාර්‍ය උපාධියක් පිරිනමා ඇත. ඔහුගේ සේවා දිවියට ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යා අංශයේ කථිකාචාර්යවරයකු ලෙස කටයුතු කළ කාල සීමාවද අයත් වන අතර ඉන් පසුව බහුජාතික සමාගම් දෙකක ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු ලෙස ද සේවය කළේය. පෙත්සම්කරුව ශ්‍රී ලංකා ක්‍රිකට් මණ්ඩලය විසින් ටෙස්ට් විනිසුරුවරයෙකු ලෙස ප්‍රතීතනය කරන ලදී. 1992 දී පාර අද්දර වූ ගසක් ඔහුගේ මෝටර් රථයට වැටීම නිසා පෙත්සම්කරුට බරපතල තුවාල සිදු වූ අතර ඔහු දෙපා අප්‍රාණික තත්වයට පත්විනි. එතැන් සිට පෙත්සම්කරු ජන සමාජය තුළ එදිනෙදා ජීවිතයේදී ශාරීරික ආබාධ සහිත පුද්ගලයින් මුහුණ දෙන දුෂ්කරතා විසඳීම සඳහා ක්‍රියාකාරීව කටයුතු කරමින් සිටියි. 2005 දී පෙත්සම්කරු **"ඉදිරිය"** නමින් වන සංවිධානයක් ආරම්භ කළේය. එම සංවිධානය එදිනෙදා ජීවිතයේ ශාරීරික ආබාධ සහිත පුද්ගලයින්ට බලපාන ආබාධ සහිත තත්වයන් සම්බන්ධ ප්‍රවේශය පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් ක්‍රියා කරයි.

පෙත්සම්කරු 2009 මැයි මස 19 වන දින අංක 221/2009 දරණ ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් අයදුම්පත ගොනු කරමින් අදිවාචනය කර සිටියේ ඔහු විසින් අදාල අයදුම්පත මහජන සුබසාදක නඩුකරයක් ලෙස ආබාද සහිත පුද්ගලයන් වෙනුවෙන් සහ එම පුද්ගලයන් සඳහා වන බවයි. ඔහු විසින් අධිවාචනය කරනලද අනෙකුත් දේ අතර 1996 අංක 28 දරණ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සහ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග නියෝග අංක 1 ක්‍රියාත්මක නොකිරීම හා බලාත්මක නොකිරීම මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1), 14 (1) (උ) සහ 14 (1) (ඌ) ව්‍යවස්ථාවන් මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම්කරුට සහ ඒ හා සමාන තත්වයක සිටින සෙසු අයවලුන් කෙරෙහි උල්ලංඝනය කර ඇති බවයි. පෙත්සම්කරු සහන රාශියක් ඉල්ලා සිටිමින් යාචනය කළේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) සහ 14 (1) (උ) ව්‍යවස්ථාව යටතේ ඉදිරියට නඩු කටයුතු සිදුකරගෙන යාමට පෙත්සම්කරුට 2009 මාර්තු 24 වන දින අවසරය ප්‍රදානය කරන ලදි. පසුව, මෙම අධිකරණය විසින් එහි පෙර නියෝගය පැහැදිලි කරමින් 2009 ඔක්තෝබර් 14 වන දින මූලික නියෝගයක් සහ නියෝගයක් නිකුත් කරන ලදී. පසුව, එම අවසන් නියෝගයේ දක්වා ඇති සහන ලබා දෙමින්

අධිකරණය විසින් 2011 අප්‍රේල් 27 දිනැති අවසන් නියෝගයක් නිකුත් කරන ලදී. 2011 අප්‍රේල් 27 දිනැති එම අවසන් නියෝගය වචනානුසාරයෙන්ම පහත දැක්වෙන ආකාරයට පිටපත් කරනු ලැබේ.

*"මෙම නඩුව 2009ක්වූ 10 වන මස 14 වන දිනැති තීන්දුව තවදුරටත් පැහැදිලි කිරීමේ අරමුණින් කැඳවනු ලැබේ.*

*සියලු පාර්ශවයන්ගේ තර්ක විමසීමෙන් අනතුරුව, 2009ක්වූ 10 වන මස 14 වන දින ලබා දෙන ලද තීන්දුව අධිකරණය විසින් මතු සඳහන් තීන්දුවෙන් ප්‍රතිස්ථාපනය කරනු ලැබේ:*

*මිනිසුන්ට නිදහසේ සංචරණයේ හැකියාවේ විවිධ මට්ටම් පවතින බව මෙම අධිකරණය පිළිගන්නා අතරම, ඉතා විශාල සංඛ්‍යාවක් විශේෂයෙන්ම වැඩිවෙමින් පවතින ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, ආබාධ සහිත තැනැත්තන් හා ගර්භණී මවුවරුන් යාම් ඊම් වලදී සීමාවලට මුහුණ දෙන බව ද මෙම අධිකරණය පිළිගනියි.*

*එසේම, සංශෝධිත 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ පනත හා එම පනත යටතේ පනවනු ලැබ ඇති නියෝග ප්‍රකාරව කිසිඳු තැනැත්තෙක් තමාගේ ආබාධ සහිත භාවය යන පදනම මත වෙනස්කොට සැලකීමකට ලක් නොවිය යුතු අතර එම තත්වය හේතුවෙන් එදිනෙදා ජීවිතයේ දී මානව-නිර්මිත පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන හා එම ස්ථාන වල සපයා ඇති පහසුකම් වෙත ප්‍රවේශ වීමේ, ආරක්ෂාවේ හා වාසය කිරීම සම්බන්ධයෙන් ඔවුන්ට වන සහජ අයිතිය සමානව භුක්ති විඳීමට බාධා වන අයුරින් ඔවුන්ගේ සංචරණය සීමා නොකළ යුත්තේය.*

*ඒ අනුව, මෙතැන්සිට සියලුම නව පොදු ගොඩනැගිලි හා පොදු ස්ථාන විශේෂයෙන් වැසිකිළි හා සේදීම් පහසුකම් සලසන ස්ථානයන් සංශෝධිත 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ පනත යටතේ පනවනු ලැබ ඇති 2006 අංක 01 දරණ ප්‍රවේශය සම්බන්ධ රෙගුලාසීන්හි අර්ථ දක්වා ඇති ආකාරයට දැනට බලාත්මක රෙගුලාසීන්හි 'සැලසුම් අවශ්‍යතා' වන්ට අනුකූල වන ආකාරයෙන් සැලසුම් කිරීම හා ඉදිකිරීම කල යුතු බව මෙම අධිකරණය විසින් තවදුරටත් නියෝග කෙරේ.*

*එසේම, ගොඩනැගිලි සැලසුම් සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා, ඉදිකිරීම අවසන් කරන ලද ගොඩනැගිලි සඳහා අනුමැතිය ලබා ගැනීම හා ඉදිකිරීම් අවසන් කරන ලද ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා මෙම අධිකරණ නියෝගයට අනුකූලව ක්‍රියාකිරීම අනිවාර්ය වේ. එබැවින් එම බලතල ක්‍රියාත්මක කරන සියලුම බලාධිකාරීන් විසින් මේ සම්බන්ධයෙන් සමාන වගකීමක් දරන ගොඩනැගිලි හිමිකරුවන් ද සමඟ මෙම නියෝගය උල්ලංඝනය කරන සියලු නව ඉදිකිරීම් සම්බන්ධයෙන් ඉහත එසේ කිරීමෙන් වැළකී සිටිය යුතුය.*

*මෙම අධිකරණ තීන්දුව අනුගමනය කිරීමට අපොහොසත් වීම දඬුවම් ලැබිය හැකි බරපතල වරදක් වන අතර නීතියෙන් දක්වා ඇති ආකාරයේ දඬුවම් වලට යටත් වීමට සිදු වේ.*

*මෙම නඩු කටයුතු මෙයින් අවසන් කරනු ලැබේ. පසුව අලුතින් සිදු වන උල්ලංඝනයකදී එම තත්වය සම්බන්ධයෙන් එම අවස්ථාවේදී කටයුතු කරනු ලැබේ."*

පසුව, පෙත්සම්කරු විසින් 2013 මැයි 03 සහ 2013 මැයි 14 දිනැති මෝසම් ගොනු කරනලද අතර, ඉහත නියෝගයේ විෂය පථය ට අයත් වන අලුතින් ඉදිකරන ලද පොදු ව්‍යුහයන් සහ පහසුකම් සම්බන්ධයෙන් තවත් නියෝගයක් ලබා දෙන ලෙස පෙත්සම්කරු ඉල්ලා සිටියේය. මෙම මෝසම්වලට අනුකූලව, වර්ෂ 2013ක් වූ ජූනි මස දාහත් වන දින මෙම අධිකරණය විසින් පෙත්සම්කරුගේ හා නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයාගේ දේශන ආශ්‍රයෙන් නඩුව විභාගයට ගත් අතර එදිනම නිකුත් කරන ලද නියෝගය මින් මතු වචනානුසාරයෙන්ම පිටපත් කර ඇත:

"මෙම අධිකරණය ඉදිරියේ තමාම පෙනී සිටි පෙත්සම්කරු වන අජිත් පෙරේරා මහතා ට සවන් දී තිබේ. මෙම අධිකරණය නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් රාජරත්නම් මහතාට ද සවන් දී තිබේ.
2012 ඔක්තෝම්බර් 04 දිනැති චක්‍රලේඛ අංක MSS / 7/8 / ACC මගින් අධිකරණ නියෝගයට අනුකූල වීම සහතික කිරීම සඳහා ඉතා පුළුල් උපදෙස් ලබා දී ඇති බවත් එය සියලු අමාත්‍යාංශ සියලුම පළාත් අමාත්‍යාංශ සහ ලේකම්වරුන් සහ සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යොමු කර ඇති බවත් රාජරත්නම් මහතා අධිකරණයට දැනුම් දෙයි. මෙම චක්‍රලේඛය ඉතා සවිස්තරාත්මක වන අතර, වෙනත් ආකාරයකින් ආබාධ සහිත වූවන්ට හෝ සීමිත හැකියාවක් ඇති අයට ප්‍රජාව සමඟ නිදහසේ ඒකාබද්ධ වීමට සෑම අවස්ථාවක්ම ලබා දීම සහතික කිරීම සඳහා රාජ්‍ය ආයතන දිරිමත් කරනු ඇතැයි මෙම අධිකරණය විසින් නිරීක්ෂණය කරනු ලබයි.

මෙම නියෝගය වහාම සමාජ සේවා අමාත්‍යාංශයේ ලේකම් වෙත සන්නිවේදනය කරන ලෙස රෙජිස්ට්‍රාර්වරයාට නියම කරනු ලැබේ.

ඉහත සඳහන් චක්‍රලේඛය පිළිබඳව දැනුවත්ව සිටීමේ අවශ්‍යතාව පිළිබඳව පෞද්ගලික අංශය සංවේදී කිරීම සඳහා ක්ෂණික පියවර ගන්නා ලෙස බලධාරීන්ට උපදෙස් දීමෙන් චක්‍රලේඛයට එහි පූර්ණ අනුබලය ලබා දෙන ලෙස උගත් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා ට නියෝග කරසිටී."

ඉහත නියෝගයේ සඳහන් කර ඇති චක්‍රලේඛ අංක MSS / 7/8 / ACC සමාජ සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇත. එය අමාත්‍යාංශවල සියලුම ලේකම්වරුන්, පළාත් සහා ප්‍රධාන ලේකම්වරුන් සහ සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යොමුකර තිබේ.

තවද, මෙම චක්‍රලේඛය 1996 අංක 28 දරණ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ ප්‍රකාශයට පත් කර තිබෙන 2006 අංක 1 දරණ ආබාධ සහිත සහිත තැනැත්තන් පිළිබඳ

(ප්‍රවේශ) නියෝගවලට සහ 2009 සැප්තැම්බර් 18 දිනැ එම නියෝගවලට සිදු කරන ලද සංශෝධනයන්ට ලිපි හිමියන්ගේ අවධානය යොමු කරයි.

චක්‍රලේඛයේ සඳහන් වන්නේ ඉහත සඳහන් නියෝගවලට අනුකූලව ආබාධ සහිත පුද්ගලයින් සඳහා සියලුම පොදු ගොඩනැගිලි සහ පොදු ස්ථාන ප්‍රවේශ පහසුකම් සැපයිය යුතු බවත්, ඉහත නියෝගවලට අනුකූලව ඒවා ඉදිකර නොමැති නම් ඉහත නියෝගවලට අනුකූල වන පරිදි ඉදිකළ යුතු බවත් අලුතින් ඉදිකරන ලද පොදු ගොඩනැගිලි ඉහත නියෝගවලට අනුකූලව ඉදිකර නොමැති නම් අනුකූලතා සහතිකය.නිකුත් නොකළ යුතු බවත් චක්‍රලේඛයේ සඳහන් වේ.

මෙම අධිකරණය විසින් SC FR 221/2009 දරන මූලික අයිතිවාසිකම් අයදුම්පත ට අදාළව 2011 අප්‍රේල් 27 දිනැති නියෝගයට සහ 2011 අප්‍රේල් 29 දිනැති කැබිනට් තීන්දුවක් වෙත චක්‍රලේඛයේ අවධානය යොමු කර තිබේ. ආබාධ සහිත පුද්ගලයින් සඳහා ප්‍රවේශවීමේ පහසුකම් 2014 ඔක්තෝබර් 16 දිනට පෙර, චක්‍රලේඛය මගින් අවදානය යොමුකර ඇති සියලුම පොදු ගොඩනැගිලිවල ලබා දිය යුතු බව චක්‍රලේඛයෙන් නියම කෙරේ. චක්‍රලේඛයේ සඳහන් ලියකියවිලි චක්‍රලේඛයට අමුණා ඇත. කලින් සඳහන් කළ පරිදි, 2011 අප්‍රේල් 27 දිනැති SC FR 221/2009 දරන මූලික අයිතිවාසිකම් අයදුම්පතට ලබා දී ඇති නියෝගය ප්‍රකාරව එම නියෝගය උල්ලංඝනය වුවහොත් පෙත්සම්කරුට නව අයදුම්පතක් ඉදිරිපත් කිරීමට අවසර දී ඇත.

**පෙත්සම්කරුගේ වර්තමාන අයදුම්පත**

පෙත්සම්කරු විසින් 2018 සැප්තැම්බර් මස 03 වන දින SC FR application no.273/2018, දරන උක්ත අයදුම්පත පෙත්සමක් හා දිවුරුම් ප්‍රකාශයක් මගින් ගොනු කරන ලදී. පසුව ඔහු සංශෝධිත පෙත්සමක් ගොනු කළේය.

වර්තමාන අයදුම්පතට වගඋත්තරකරුවන් වන්නේ: (i) ගරු. සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍ය සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ජාතික කවුන්සිලයේ සභාපති; (ii) ගරු. පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා; (iii) ගරු. නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා; (iv) ගරු. මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යවරයා; (v) ගරු. අධ්‍යාපන අමාත්‍යවරයා; (vi) ගරු. අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා; (vii) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය; (viii) නාගරික සංවර්ධන අධිකාරිය සහ (ix) ගරු. නීතිපතිවරයා යි.

පෙත්සම්කරු සඳහන් කරන්නේ තමන් මෙම ඉල්ලීම ඉදිරිපත් කරන්නේ මහජන සුබසාදනය උදෙසා සහ ශ්‍රී ලංකාවේ ශාරීරික ආබාධ සහිත පුද්ගලයින් විශාල සංඛ්‍යාවකට ඔවුන්ගේ සංචලතාවයට බාධාවක් ඇතිවී

තිබන බවයි. ඔවුන්ගේ මූලික මානව ගරුත්වය සුරක්ෂිත කිරීම සඳහා තමා මෙම අයදුම්පත ගොනු කරන බව පෙත්සම්කරු ප්‍රකාශ කර සිටියි.

පෙත්සම්කරු 2003 අංක 33 පනත මගින් සංශෝධනය කරන ලද 1996 අංක 28 දරණ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 23 (2) සහ 23 (3) වගන්තිය වෙත අවධානය යොමු කරයි. පෙත්සම්කරු සඳහන් කරන පරිදි පනත මගින් තමාට පවරා ඇති ව්‍යවස්ථාපිත බලතල අනුව, අමාත්‍යවරයා විසින් 2006 අංක 1 දරණ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග අංක 1467/15 අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති බවයි. 2009 සැප්තැම්බර් 18 දිනැති 1619/24 අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2009 සැප්තැම්බර් 18 දිනැති නියෝග මගින් සංශෝධනය කරන ලද 2006 [අංක 18 දරණ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග 2009 සැප්තැම්බර් 18 දිනැති නියෝග මගින් සංශෝධනය කරන ලද නියෝග මෙතැන් සිට සංයුක්තව ''නියෝග'' ලෙස හැඳින්වේ.

පෙත්සම්කරු අධියාචනය කර සිටිනුයේ ඉහත සඳහන් නියෝග මගින් පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන සහ පොදු සේවාවන් සපයන ස්ථානවල විවිධ කොටස් හෝ ප්‍රදේශ සැලසුම් කර ඇති අතර එමඟින් ආබාධ සහිත පුද්ගලයින්ට එම ස්ථානවලට ආරක්ෂිතව හා පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි නිර්මාණය කර ඇති බවයි. නියෝග ක්‍රියාත්මක වූ දා සිට වසර 11 ක කාලයක් තුළ පවත්නා සියලුම පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන සහ පොදු සේවාවන් ඇති ස්ථාන නියෝග වල විධිවිධානවලට අනුකූල විය යුතු බව නියෝග වල සඳහන් වේ.

තවද, අදාළ ගොඩනැගිලි සැලැස්ම '*කාර්යසාධන පිරිවිතරයන්ට*' සහ නියෝග.,,මෝස්තරවලට අනුකූල නොවන්නේ නම්, පොදු ස්ථානයක පිහිටා ඇති පොදු ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් අනුකූලතා සහතිකයක් නිකුත් නොකරන බව නියෝග වල සඳහන් වේ.

පැමිණිලිකරුගේ අයදුම්පතේ හරය නම්, ඉහත සඳහන් පනතේ විධිවිධාන හා නියෝග වලට අනුකූල නොවීම, පෙත්සම්කරු සහ ඒ හා සමාන තත්වයක් ඇති වෙනත් අය විශාල පිරිසකට පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන සහ පොදු සේවාවන් ඇති ස්ථාන විශාල සංඛ්‍යාවකට ප්‍රවේශ ලබා ගත නොහැකි හැකි හෝ ඔවුන්ට දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු වන අතර ඔවුන් එවැනි ගොඩනැගිලි සහ ස්ථානවලට පිවිසෙන විට ඔවුන්ගේ ආරක්ෂාව අනතුරේ හෙළනු ඇතැයි යන ඔහු කළ පැමිණිල්ලයි.

පෙත්සම්කරු අධියාචනය කරන්නේ, එමඟින් තමා සහ ඒ හා සමාන තත්ත්වයන් ඇති ආබාධ සහිත පුද්ගලයින් අසාධාරණ සහ නීති විරෝධී ලෙස වෙනස් කොට සැලකීම, අනර්ථකාරීවීම සහ කොන් කිරීමකට ලක්වන බවයි.

ඒ අනුව, පනතේ සහ නියෝග වල විධිවිධාන බලාත්මක කිරීම හා ඒවාට අනුකූල වීම සහතික කිරීමට වගඋත්තරකරුවන් අපොහොසත් වීම හේතුවෙන් පෙත්සම්කරුට සහ ඒ හා සමාන තත්වයක සිටින අනෙක් අයට.12 (1), 12 (2) ව්‍යවස්ථාවන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1)මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් අඛණ්ඩව උල්ලංඝනය වී ඇති බව පෙත්සම්කරු අධිවාචනය කර සිටියි.

තවද, පෙත්සම්කරු පොදු පහසුකම් සහ යටිතල ව්‍යුහය සැපයීම සඳහා යෝජිත මහා පරිමාණ ව්‍යාපෘති ගැන සඳහන් කරන අතර මෙම මහා පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඒවායේ සැලසුම් හා ඉදිකිරීම් කාර්ය සාධන පිරිවිතර "සහ,, සැලසුම් නියෝග වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු බව අත්‍යවශ්‍ය බව ප්‍රකාශ කර සිටියි.

පෙත්සම්කරු යාචනය කර සිටි අනෙකුත් කරුණු අතර,

(අ) පනතේ විධිවිධාන සහ නියෝග සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර බලාත්මක කරන බවට වග බලා ගැනීම සඳහා වගඋත්තරකරුවන් වහාම අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගත යුතු බව,

(ආ) අධියාචනය පනතේ පරමාර්ථය තුළට වැටෙන පරිශ්‍ර හා ව්‍යුහයන්ගේ අයිතිකරුවන් සහ පදිංචිකරුවන් සහ නියෝග වල විධිවිධානවලට අනුකූල වන බවට වගකිව යුතු නියෝග, රීති හෝ අනු නීති නිකුත් කිරීමට වගඋත්තරකරුවන්ට උපදෙස් දීම.

යාචන (ඇ) සහ (ඈ) ය.

වගඋත්තරකරුවන් නව දෙනාටම නොතීසි නිකුත් කර ඇත. පසුව මෙම අයදුම්පත 2018 සැප්තැම්බර් 20 වන දින විභාගයට ගත් විට උගත් රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙකු පෙනී සිටිමින් 1 වන වගඋත්තරකරුගෙන් තමාට සීමිත උපදෙස් ඇති බවත් 8 වන වගඋත්තරකරුගෙන් උපදෙස් ලබා ගැනීමට තමා කැමති බවත් ප්‍රකාශ කළේය. 2 සිට 7 දක්වා වගඋත්තරකරුවන් ට මේ පිළිබඳ නොතීසි නිකුත් කර තිබියදීත් ඔවුන් නියෝජනය නොවීය.

ඉන්පසුව, මෙම අයදුම්පත 2018 ඔක්තෝබර් 04 දින විභාගයට ගන්නා ලදී. රජයේ උගත් ජ්‍යෙෂ්ඨ නීතිඥවරයා ගරු. නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටියේ ය. දේශනයන් විභාග කිරීමෙන් අනතුරුව මෙම අධිකරණය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) සහ 14 (1) (උ) ව්‍යවස්ථා යටතේ නඩු කටයුතු ඉදිරියට ගෙනයාමට පෙත්සම්කරුට අවසරය ප්‍රදානය කර ඇත. අනතුරුව මෙම අයදුම්පත 2018 නොවැම්බර් 15 වන දින සලකා බැලූ විට රජයේ උගත් ජ්‍යෙෂ්ඨ නීතිඥ වරයා කියා සිටියේ 9 වන වගඋත්තරකරු වන ගරු නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටීමට අමතරව 8 වන වගඋත්තරකරු වන නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පෙනී සිටින බවයි.

එදින, අධිකරණය විසින් මෙම අයදුම්පත 2018 නොවැම්බර් 29 දිනට විභාගයට ගැනීම සඳහා නියම කරන ලදී. රජයේ උගත් ජ්‍යෙෂ්ඨ නීතිඥවරයාට 1 සිට 7 දක්වා වගඋත්තරකරුවන් සහ මෙම කාරණය සම්බන්ධයෙන් ඔවුන්ට උපදෙස් ලබා දීමට ඇත්දැයි සොයා බැලීම. අධිකරණය නියම කළේය.

එම ඉල්ලීම අනුව රජයේ උගත් ජ්‍යෙෂ් ඨ නීතිඥවරයා අදාළ අමාත්‍යාංශවල ලේකම්වරුන් සම්බන්ධ කර ගැනීමට හා ඔවුන්ගේ උපදෙස් ඇත්නම් ඒවා ලබා ගැනීමට කටයුතු කිරීම බාරගත්තේ ය. එය සිදුකර ඇතය යන පදනම මත අපි ඉදිරියට යන්නෙමු.

අනතුරුව, ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලයේ වැඩබලන අධ්‍යක්ෂ විසින් 2019 මැයි 21 දිනැති දිවුරුම් ප්‍රකාශයක් ගොනු කර ඇත. "R1" සිට "R20" දක්වා සලකුණු කර ඇති ලේඛන මෙම දිවුරුම් ප්‍රකාශයට අමුණා ඇත.

මෙම දිවුරුම් ප්‍රකාශය ගොනු කරන අවස්ථාවේ දිවුරුම් ප්‍රකාශයේ සඳහන් පරිදි ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය නිවාස හා සමාජ සුභසාධන අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් කරන ලදී. කෙසේ වෙතත්, මේ වසරේ ජනවාරි මාසයේදී නව අමාත්‍ය මණ්ඩලයක් පත් කිරීමත් සමඟ, ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය දැන් ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයට අයත් වේ.

ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලයේ වැඩබලන අධ්‍යක්ෂවරයා රජය සහ එහි නියෝජිතායතන විසින් ගෙන ඇති ස්ථාවරය වනුයේ පනතේ විධිවිධාන හා නියෝග වලට අනුකූලව ක්‍රියාත්මක කිරීම හා සහතික කිරීම සඳහා අඛණ්ඩව පියවර ගනිමින් සිටින බවයි. එම පදනම මත පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව ඔහු ප්‍රතික්ෂේප කරයි.

2018 නොවැම්බර් 29 වන දින මෙම අයදුම්පත විභාග කිරීම සඳහා සලකා බැලූ අවස්ථාවේදි පෙත්සම්කරු පෞද්ගලිකව කරුණු ඉදිරිපත් කළ අතර රජයේ උගත් ජ්‍යෙෂ්ට නීතිඥවරයා සැකෙවින් කරුණු ඉදිරිපත් කළේය. 2 සිට 7 දක්වා වගඋත්තරකරුවන් පෙනී නොසිටි අතර, මෙම අයදුම්පත පිළිබඳ නොතීසි නිකුත් කර තිබියදීත්, ඉන් පසුවද ඔවුන්ගේ උපදෙස් තිබේදැයි සොයා බැලීමට රජයේ උගත් ජ්‍යෙෂ්ඨ නීතිඥවරයකු විසින් විමසීමක් කළද, ඔවුන් ඉදිරිපත් නොවීය. ඔවුන් නිසැකවම, මෙම අයදුම්පත පිළිබඳව දැනුවත්ව සිටින නමුත් පෙනී නොසිටීමට තීරණය කර ඇති අතර මෙම ක්‍රියාදාමයන් නියෝජනය කරනු ඇත. මෙම තත්වයන් යටතේ, 1 සිට 8 දක්වා වගඋත්තරකරුවන් සියල්ලන්ම මෙම අයදුම්පතේ තීන්දුව සහ නියෝග වලට බැඳී සිටී.

**තීරණය**

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 8.6% කට යම් ආකාරයක ආබාධ සහිත තත්ත්වයක් ඇති බව 2012 ජන සංගණනයේදී සංඛ්‍යාලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වාර්තා කරයි. ඒ අනුව අපේ රටේ සෑම දොළොස් දෙනාගෙන් එක් අයෙකුට ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේදී ඔහුගේ හෝ ඇයගේ ආබාධ සමඟ කටයුතු කළ යුතු වන බවයි. ශ්‍රී ලංකාවේ පමණක් නොව මෙම තත්වය ලෝකයේ සෑම ප්‍රදේශයකම ආබාධ සහිත පුද්ගලයින් ද එම දුෂ්කරතාවන්ට මුහුණ දී සිටී. එවකට එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා මේ බව අවධාරණය කළේ 2009 දෙසැම්බර් 03 වන දින *"ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ජාත්‍යන්තර දිනය"* නිමිත්තෙනි. ඔහු මෙසේ පැවසීය.

*"අප සියලුදෙනාම, විශේෂයෙන් මහලු වන විට තාවකාලික හෝ ස්ථිර ආබාධ සහිත තත්වයට, භාජනය වියහැකි ය. බොහෝ රටවල, අවම වශයෙන් දහයෙන් එක් අයෙකු ශාරීරික, මානසික හෝ සංවේදක දුර්වලතා හේතුවෙන් ආබාධ සහිත වේ. ආබාධ සහිත තත්ත්වයේ ප්‍රතිවිපාකයන්වලට ගෝලීය ජනගහනයෙන් හතරෙන් එකක් රැකබලා ගන්නන් හෝ පවුලේ සාමාජිකයන් ලෙස සෘජුවම මුහුණදෙති. ආබාධ සහිත පුද්ගලයින්ට බොහෝ අවාසි වලට මුහුණ දීමට සිදුවේ. ඔවුන් බොහෝ විට සමාජයේ දුප්පත්ම හා බැහැර කරන ලද සාමාජිකයන් වේ. එහෙත් ඔවුන් පුරුද්දක් ලෙස විශාල ඔරොත්තු දීමක් පෙන්වන අතර මානව ප්‍රයත්නයේ සෑම විෂයකින්ම පාහේ අග්‍රස්ථානයන් ට ළඟා වේ."*

බෑන් කී මූන් සඳහන් කළේ ආබාධ සහිත පුද්ගලයින් ප්‍රජාවේ අන් අය සමඟ බෙදා හදා ගන්නා ශක්තියට ඔරොත්තු දීමේ සහ කැපවීමේ ස්වභාවය ගැන ය. වයස මාස දහනවයක් වන විට රෝගයක් හේතුවෙන් අන්ධ හා බිහිරි වූ හෙලන් කෙලර් රැඩ්ක්ලිෆ් විද්‍යාලයෙන් phi beta kappa උපාධිය ලබාගෙන කීර්තිමත් කතුවරියක, සන්චාරිකාවක සහ සමාජ හා දේශපාලන ක්‍රියාකාරිනියක බවට පත් වූ විට එම ශක්තිය හා කැපවීම මනාව විදහා දැක්වෙයි. ඇය වරෙක ප්‍රකාශ කළේ, *"මම එක් කෙනෙක් පමණයි. නමුත් තවමත් මම එක් කෙනෙක්. මට සෑම දෙයක්ම කළ නොහැක, නමුත් මට තවමත් යමක් කළ හැකිය; මට කළ හැකි දෙයක් කිරීම මම ප්‍රතික්ෂේප නොකරමි."* ඉන්දියාවේ ශ්‍රේෂ්ඨාධිකරණය මෙම ප්‍රකාශය මෙහි පසුවට සලකා බැලෙන JEEJA GHOSH vs. UNION OF INDIA [2016 Indlaw SC 381 නඩුවෙහි 29වන ඡේදයේ දී සඳහන් කරන ලදි. කෙසේ වෙතත්, කෙලර් මෙම ප්‍රකාශය කතුවරයෙකු වන එඩ්වඩ් එවරට් හෝල් උපුටා දක්වමින් පැවසූ බව ද කියැවෙන බව සඳහන් කළ යුතුය.

මහජනතාවගෙන් සැලකිය යුතු කොටසකින් සමන්විත ආබාධ සහිත පුද්ගලයින්ට ඔවුන්ගේ එදිනෙදා කටයුතු සිදුකිරීමට ප්‍රජාවේ අනෙක් අයට එම අවස්ථාව ලැබෙනවා සේම එදිනෙදා ක්‍රියාකාරකම් සහ සජීවී තෘප්තිමත් හා සාර්ථක ජීවිත ගත කිරීමට අවස්ථාව ඇති බව සහතික කිරීම සඳහා සාධාරණ හා ප්‍රමාණවත්

පියවර ගැනීම රාජ්‍යයේ හා ජනතාවගේ යුතුකම් බව අද්‍යතනයේදී පුළුල්ව පිළිගෙන ඇති ප්‍රමිතිය ඉස්මතු කිරීමට මෙම ප්‍රකාශයන් උපකාරී වේ.

ඓතිහාසිකව, සමාජය මේ සමඟ කටයුතු කිරීමට පෙළඹුණේ වෛද්‍ය ප්‍රතිකාර, සෞඛ්‍ය සේවා සැපයීම සහ ආබාධ සහිත පුද්ගලයින්ට ඔවුන්ගේ ශාරීරික හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා සහාය වීම සහ ආබාධ සහිත පුද්ගලයින්ගේ නවාතැන්, සුබසාධනය සහ ආරක්ෂාව සඳහා වෙනම පහසුකම් සැපයීමෙනි. මෙම ප්‍රවේශය ආබාධ සහිත පුද්ගලයින්ට සහාය දැක්වීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් කටයුතු කරන රජයේ වෛද්‍ය ආකෘතිය ලෙස හැඳින්වේ.

කෙසේ වෙතත්, 1960 දශකයේ අග භාගයේ සිට විකල්ප ප්‍රවේශයක් පුළුල් පිළිගැනීමක් ලබා ගත්තේය. '*වෛද්‍ය ආකෘති* ප්‍රවේශය බොහෝ විට යම් තරමක ආන්තීකරණයකට සහ ඇතැම් විට ආබාධ සහිත පුද්ගලයින් සෙසු ප්‍රජාවෙන් හුදෙකලා කිරීමට පවා හේතු වූ අත්දැකීම් මත පදනම් විය. මෙම අත්දැකීම ආබාධ සහිත පුද්ගලයින්ගේ එදිනෙදා ජීවිතයේදී මුහුණ දෙන දුෂ්කරතා වඩාත් ඵලදායී ලෙස ප්‍රතික්ෂේප කළ හැකි බවට විශ්වාසයක් ඇති කිරීමට හේතු විය.

ප්‍රජාවේ අන් අය සමඟ සමානාත්මතාවයේ වේදිකාවක් මත පුද්ගලයන්ට ඔවුන්ගේ එදිනෙදා ජීවිතය ගත කිරීමට හැකි වන පරිදි ආබාධ සහිත පුද්ගලයින්ට පොදු ගොඩනැගිලි සහ පොදු පහසුකම් පහසුවෙන් ප්‍රවේශ විය හැකි හා භාවිතා කිරීමට, තොරතුරු ලබා ගැනීමට, සන්නිවේදනය කිරීමට, ඉගෙනීමට හා අන් අය සමඟ ප්‍රජාව තුළ වැඩ කිරීමට පහසුකම් සපයන පහසුකම් සැපයීමෙන් සහ ආබාධ සහිත පුද්ගලයින් කෙරෙහි ප්‍රජාවට ඇති ඕනෑම නිෂේධාත්මක ආකල්ප වෙනස් කිරීමෙන්. මෙය සැලකිය යුතු මට්ටමකට ළඟා කර ගත හැකි බවයි; මෙම න්‍යායට යටින් දිවෙන විශ්වාසය වූයේ ආබාධ සහිත පුද්ගලයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා සමාජය සංවිධානය වී ඇති ආකාරය වැඩිදියුණු කිරීම තුළින් ඔවුන්ට සමානව ප්‍රජාව සමඟ ඒකාබද්ධ වීමට හැකි වනු ඇති බවයි. මෙම ප්‍රවේශය බ්‍රිතාන්‍ය ශාස්ත්‍රාලික උගතෙකු වූ මහාචාර්ය මයිකල් ඔලිවර් විසින් *"ආබාධ සහිත සමාජ ආකෘතිය"* ලෙස නම් කරන ලදී.

ආබාධ සහිත පුද්ගලයින්ට ප්‍රජාව සමඟ අන්තර් ක්‍රියාකාරිත්වයේ දී ඇති වන බාධක සම්බන්ධයෙන් කටයුතු කිරීමේ 'සමාජ ආකෘතිය' රඳා පවතින්නේ ආබාධ සහිත පුද්ගලයින්ට ප්‍රජාව තුළ ජීවත්වීමට, ඉගෙනීමට හා වැඩ කිරීමට සමාජයේ ජීවත්වන සෙසු පුද්ගලයන්ට මෙන්ම සමාන අවස්ථාවන් ලබා දිය යුතු ය යන පදනම මත ය. ඇමරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ආබාධ සහිත අයිතිවාසිකම් පිළිබඳ විශේෂ උපදේශක ලෙස සේවය කළ කීර්තිමත් ආබාධ සහිත අයිතිවාසිකම් ක්‍රියාකාරිනියක වන ජුඩිත් හියුමන් මෙම ප්‍රවේශයේ ඵලදායීතාවය සාරාංශ කරමින් ප්‍රකාශ කළේ "සමාජය අසමත් වූ විට පමණක් ආබාධ සහිතභාවය මට බේදවාචකයක් බවට පත්වේ. අපගේ ජීවිත ගත කිරීමට අවශ්‍ය දේ සැපයීමට - උදාහරණයක් ලෙස රැකියා අවස්ථා හෝ බාධක රහිත ගොඩනැගිලි. මම ජීවත් වන්නේ රෝද පුටුවක වීම

මට බේදවාචකයක් නොවන බවයි. *"සමාජ ආකෘතිය"* මගින් සංකල්පනය කරන ලද නීර්නයන් පිළිබඳ ප්‍රවේශයක් වෛද්‍ය ආකෘතියේ ප්‍රවේශයට අත්‍යවශ්‍ය අනුකූලතාවයක් බව පුළුල් පිළිගැනීමක්, වූ අතර එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් අවස්ථා සමානාත්මතාවය පිළිබඳ රීති සම්මත කිරීමට හේතු වූ එක් සාධකයක් ද විය. ආබාධ සහිත පුද්ගලයින් සඳහා - 1993 දෙසැම්බර් 20 වන දින. එහි සඳහන් රීති 22 කලින් සඳහන් කළ ආකෘති දෙකේම ප්‍රධාන සංකල්පයන්ගෙන් උපුටා ගත් අතර, ආබාධ සහිත පුද්ගලයින්ට අන්තර් අන්‍යෝන්‍ය වශයෙන් ආධාර කිරීමට රාජ්‍යයන් දරන උත්සාහයට මඟ පෙන්වීම සඳහා:

(i) වෛද්‍ය ප්‍රතිකාර, පුනරුත්ථාපන සහ උපකාරක සේවා සැපයීම;

(ii) ආබාධ සහිත පුද්ගලයින්ට සමාන පදනමක් මත සහභාගී විය හැකි බව සහතික කිරීම අරමුණු කරගත් ප්‍රවේශ පහසුකම්, අධ්‍යාපන ආධාර, රැකියා අවස්ථා, විනෝදාත්මක හා සංස්කෘතික අවස්ථා ලබා දීම, ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සහ ප්‍රජාවේ එදිනෙදා කටයුතුවලදී ආබාධ සහිත පුද්ගලයින්ට අන්‍යයන් සමඟ සමාන පදනමක් මත සහභාගී විය හැකි බව සහතික කිරීම අරමුණු කරගත් වෙනත් සමාජ මුල් පිරීම් පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීම

මෙය ඉදිරියට ගෙන යාම සඳහා, මීට පෙර සඳහන් කළ සාකච්ඡාවෙන් පැහැදිලි වන්නේ, අද ලෝකයේ, ආබාධ සහිත පුද්ගලයින්ට ඔවුන්ගේ එදිනෙදා ජීවිතය ප්‍රජාවේ අන් අය සමඟ සමානාත්මතාවයෙන් යුතුව ගතකිරිමට අවස්ථාව ලබා දීම සඳහා සම බිමක් සහතික කිරිම ට එක් එක් රාජ්‍යයට පැවරී ඇති යුතුකමක් පිළිගෙන ඇති බවයි.

මෙම වගකීමට අනුකූල වෙමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව පනත සම්මත කර නියෝග පනවන ලදී. මෙහිදී සඳහන් කළ යුතු කරුණක් වන්නේ මෙය ශ්‍රී ලංකාව 2007 දී අත්සන් කොට 2016 දී අපරානුමත කරන ලද එක්සත් ජාතීන්ගේ සම්මුතිය ඇති කර ගැනීමට බොහෝ කලකට පෙර සිදු වූවක් බවයි.

වසර කිහිපයකට පසුව 2003 වසරේදී සමාජ සුභසාධන අමාත්‍යාංශය විසින් සකස් කරන ලද ආබාධ සහිතභාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ දක්වන ලද ආකාරයට:

*"ආබාධ සහිතභාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සමාජ සාධාරණත්වයේ නාමයෙන් ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කරයි. සම්පූර්ණ හා තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමටත්, ශ්‍රී ලංකාවේ සමාන පුරවැසියන් වශයෙන් ඔවුන්ගේ දැනුම, පළපුරුද්ද හා විශේෂිත හැකියාවන් මගින් ජාතික සංවර්ධනයට දායකත්වය ලබා දීමට සමාන අවස්ථා ඔවුන් වෙත හිමිවනු ඇත [අවධාරණය කරන ලද].*

පනතේ විධිවිධාන හා ආබාධ සහිතභාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය විමසා බැලීමේ දී පැහැදිලි වන්නේ එහි ප්‍රකාශිත රජයේ ප්‍රතිපත්තිය වන්නේ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය

කිරීම හා ඉදිරියට ගෙන යාම සහ එසේ කිරීමේ දී ආබාධ සහිත තැනැත්තන් සඳහා සමාන අවස්ථා ලබා දීම සහතික කිරීමෙන් ඔවුන් අනෙක් තැනැත්තන්ට වඩා අවාසි සහගත තත්වයකට පත්කිරීමක් හෝ වෙනස් කොට සැලකීමකට හෝ කොන් කිරීමකට ලක් නොකිරීම සහතික කිරීම යි.

එසේම, පනතේ ප්‍රතිපාදන සහ ඒ යටතේ පනවා ඇති නියෝග විමසා බැලීමේ දී තවදුරටත් පැහැදිලි වන්නේ මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට රජය විසින් යුතුකමක් භාරගෙන ඇති බවත් පනතේ හා ඒ යටතේ පනවනු ලැබ ඇති නියෝග වල විධිවිධාන මඟින් ව්‍යවස්ථාපිත හා නියෝගමය වශයෙන් එම වගකීම ක්‍රියාවට නංවා ඇති බවයි.

එමනිසා පනතේ දීර්ඝ නාමයේ දැක්වෙන ආකාරයට එය ***"... ශ්‍රී ලංකාවේ සිටින ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම, අභිසංවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස"*** වන පනතකි.

පනත හරහා *"ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව"* පිහිටුවනු ලැබූ අතර අමාත්‍යවරයා සභාපතිත්වය දරන මෙම සභාව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන තවත් සාමාජිකයන් 20 දෙනෙකුගෙන් සමන්විත වේ.

පනතේ 12 වන වගන්තිය දක්වන ආකාරයට:

*"ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමට, අභිසංවර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට වගබලාගැනීම සභාවේ ප්‍රධාන කර්තව්‍ය වන්නේ ය."*

ඉහතින් දක්වා ඇති සභාවේ ප්‍රධාන කර්තව්‍යයට අමතරව සභාව විසින් ඉටු කල යුතු විශේෂිත කර්තව්‍යයන් 22ක් පනතේ 13 වන වගන්තියේ දක්වා ඇත. ඒ අතරින් 13 (b) වගන්තිය ප්‍රකාරව සභාව විසින්;

*"... ආබාධ සහිත තැනැත්තන්ගේ අර්ථ සිද්ධිය හා අයිතිවාසිකම් වැඩිදියුණු කිරීම සහ ආරක්ෂා කිරීම ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය සියලු පියවර ගැනීම"* කළ යුතුය.

මේ සම්බන්ධයෙන් පනතේ 5 (ඒ), 5 (ඔ), 5 (ච) සහ 5 (ජ) වගන්ති විශේෂයෙන් අදාළ වේ. මෙම ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන දක්වන ආකාරයට සභාවේ කර්තව්‍යයන්ට: *"ආබාධ සහිත තැනැත්තන් සඳහා වඩා හොඳ ජීවන තත්වයක් ඇති කිරීමට වග බලා ගැනීම"*; *"ආබාධ සහිත තැනැත්තන්ගේ අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස සපුරාලන ලෙස වග බලා ගැනීම"*; *"සියලුම කටයුතු වලට සම්පූර්ණයෙන් සහභාගී වීමට ආබාධ සහිත තැනැත්තන් දිරිමත් කිරීම සහ ඒ සඳහා ඔවුන්ට පහසුකම් සැලසීම"*; *"ආබාධ සහිත තැනැත්තන්ට පිවිසිය හැකි සේ භෞතික පරිසරය සකස් කිරීමේ වැඩපිළිවෙලවල් හඳුන්වා දීම සහ තොරතුරු ලබාගැනීමට සහ සන්නිවේදනයට ප්‍රවේශය ආබාධ සහිත තැනැත්තන්ට ලබාගත හැකි යෝජනා ක්‍රම ඉදිරිපත් කිරීම"* ඇතුලත් වේ.

ඉහතින් සඳහන් කරන ලද ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ, අභිසංවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ දී හා ආබාධ සහිත තැනැත්තන්ට අන්අය හා සමානව සැලකීම හා සමාන අවස්ථා ලබා දීම සහතික කිරීම සම්බන්ධයෙන් පනතේ 23 (2) වගන්තිය දක්වන්නේ:

*"යම් ශාස්තුවක් ගෙවීමෙන් හෝ නොමිලයේ හෝ සමාජයේ වෙනත් කවර වුවද සාමාජිකයෙකුට ප්‍රවිෂ්ට වීමට හැකි හෝ පරිහරණය කිරීමට හිමිකම ඇති යම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට ප්‍රවිෂ්ට වීම හෝ එය පරිහරණය කිරීම සම්බන්ධයෙන්, ආබාධ සහිත යම් තැනැත්තෙකු, ඒ ආබාධය හේතුකොටගෙන යම් බැඳීමකට, කොන්දේසියකට හෝ සීමා කිරීමකට යටත් නොකළ යුතුය."*

එසේම 23 (3) වගන්තිය දක්වන ආකාරයට:

*"ප්‍රසිද්ධ ගොඩනැගිලිවලට, ප්‍රසිද්ධ ස්ථානවලට සහ පොදු සේවා වලට ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවිෂ්ට වීමට හැකි වන පරිදි පහසුකම් සැලසීමේ ක්‍රමය සහ ආකාරය නියම කරනු ලැබිය හැකි විය යුතුය."*

එසේම පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව නියම කල යුතු යයි මෙම පනතින් නියමිත හෝ නියෝග සෑදීමට පනත මඟින් නියම කොට හෝ බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් නියෝග සෑදීමට අමාත්‍යවරයා වෙත බලය පැවරී ඇත.

පනතේ 25 වන වගන්තිය සමඟ කියවන ලද 23 වන වගන්තියට අනුකූලව අමාත්‍යවරයා විසින් නියෝග [කලින් සඳහන් කරන ලද] සකස් කරන ලදී. මෙම නියෝග මඟින් පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන හා පොදු සේවා සපයන ස්ථානයන්හී පවතින හා පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන සහ පොදු සේවාවන් සපයන ස්ථාන අලුත්වැඩියා කටයුතු හා ඉදිකිරීම් වලදී අනුගමනය කළ යුතු සැලසුම් හා කාර්යසාධන නියමාවලීන් ව්‍යවුහාත්මකව හා ප්‍රමාණවත් තරම් විස්තර සහිතව දක්වන ලදී. ආබාධ සහිත තැනැත්තන්ට සාධාරණව හැකියාව ඇති තාක් දුරට පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන හා පොදු සේවාවන් සපයන ස්ථාන වලට ප්‍රවිෂ්ට වීමට හා එම පහසුකම් ලබා ගැනීමටත් එමඟින් සමාජයේ අන් අය හා සමාන මට්ටමක සිටිමින් එදිනෙදාකටයුතු සඳහා සහභාගී වීමට හැකියාව ඇති කිරීම සඳහා එසේ කරන ලදී.

බස්රථ, දුම්රිය, ගුවන් යානා සහ නැව් වැනි පොදු ප්‍රවාහනය සඳහා භාවිතා කරන වාහන සඳහා අදාළ වන අවශ්‍යතා ද නියෝග මඟින් නියම කෙරේ. තවද, දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ මග පෙන්වීම සඳහා පොදු ස්ථානවල ස්ථාපනය කළ යුතු අතිරේක ආරක්ෂක පියවරයන් ද නියෝග මඟින් නියම කරනු ලැබේ.

සංශෝධිත පෙත්සම විමර්ශනය කිරීමේ දී පෙනී යන්නේ පෙත්සම්කරුගේ අයදුම්පතේ විෂය පථය පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන සහ පොදු සේවාවන් සපයන ස්ථානවල නියෝගවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් ඔහු කළ පැමිණිල්ල බවයි. පෙත්සම්කරුගේ අයදුම්පත ආබාධ සහිත තැනැත්තෙකු රැකියා

සඳහා බඳවා ගැනීමේදී හෝ අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වීමේ දී එම ආබාධ සහිතභාවය හේතුවෙන් වෙනස් කිරීමකට ලක් නොකළ යුතු බව දක්වන පනතේ 23 (1) වගන්තිය වෙත අවධානය යොමු කරන්නේ ද එය ක්‍රියාත්මක කිරීම ගැන සඳහන් කරන්නේ ද නැත.

අප ඉදිරියේ පවතින පෙත්සම්කරුගේ අයදුම්පතේ විෂය පථය පිළිබඳ අවධානය රඳවාගෙන, මෙම අයදුම්පතෙහි විෂයගත කරුණු සම්බන්ධයෙන් අදාළ වන නියෝග කිහිපයක් පහත පරිදි එලෙසින්ම දක්වනු ලැබේ:

නියෝග වලින් සංශෝධනය කරන ලද 2(1) වන නියෝගය පහත පරිදි වේ:

*"මේ නියෝගවල විධිවිධාන ආබාධ සහිත තැනැත්තන් ප්‍රවේශ වන* ***ගොඩනැගිලි වලට, පොදු ස්ථානවලට සහ පොදු සේවාවන් සහිත ස්ථානවලට*** *අදාළ වේ."*

*"එසේ වුවද, දැනට* ***පවතින සියලුම ප්‍රසිද්ධ ගොඩනැගිලි, ප්‍රසිද්ධ ස්ථාන සහ සේවාවන් සහිත ස්ථාන මේ නියෝග ක්‍රියාත්මක වීම ආරම්භවීමෙන් වසර තුනක් ඇතුළත නියෝගවලට අනුකූල වන පරිදි ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට කරනු ලැබිය යුතුය.****"*

එසේම, 3(1) හා 3(2) නියෝගයන් දක්වන්නේ;

"3 (1) කිසිම තැනැත්තෙකු විසින්, යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලක හෝ යම් ප්‍රසිද්ධ ස්ථානයක පිහිටි ඉදිකිරීමකට අදාළ වන යම් සැලැස්මක් -

(අ) මේ නියෝගවල I වන උපලේඛනයේ I වන කොටසේ දක්වා ඇති කාර්යසාධන පිරිවිතර අනුව සකස් වී ඇත්නම්, මිස, සහ

(ආ) මේ නියෝගවල I වන උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති නිර්මාණ සැලසුම්වලට අනුව සකස් වී ඇත්නම් මිස,

ඒ ප්‍රසිද්ධ ගොඩනැගිල්ල ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම හෝ නවීකරණය කිරීම නොකළ යුතුය.

3(2) කිසිම *"අදාළ අධිකාරියක්"* විසින් යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලක් ගොඩනැංවීම, ඉදිකිරීම, ප්‍රතිසංස්කරණය කිරීම හෝ නවීකරණය කිරීම පිළිබඳ සැලැස්මක් -

(අ) මේ නියෝගවල I වන උපලේඛනයේ I වන කොටසේ දක්වා ඇති කාර්යසාධන පිරිවිතර අනුව සකස් වී ඇත්නම්, මිස, සහ

(ආ) මේ නියෝගවල I වන උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති නිර්මාණ සැලසුම්වලට අනුව සකස් වී ඇත්නම් මිස,

අනුමත කිරීමේ සහතිකයක් නිකුත් කරනු නොලැබිය යුතුය.''

4 (1) හා 4 (2) නියෝග දක්වන ආකාරයට;

*''4 (1) යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලක, ප්‍රසිද්ධ ස්ථානයක හෝ පොදු ස්ථානයක හෝ පොදු සේවාවන් සහිත ස්ථානයක, රෝද පුටු, කිහිළිකරු සහ ඇවිදීමේ ආධාරක වැනි සංචරන උපකරණ භාවිත කරන තැනැත්තන් සඳහා මේ නියෝගවල I වන උපලේඛනයේ IIඅ කොටසේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට, ප්‍රමාණවත් ඉඩකඩ වෙන් කරනු ලැබිය යුතුය.*

*4 (2) යටත් පිරිසියෙන් ඒකක විස්සක් (20) ඇති සියලුම නිවාස යෝජනා ක්‍රමවල යටත් පිරිසියෙන් සියයට පහක (5%) ප්‍රමාණයක්වත් නිවාස, මෙහි IIආ කොටසේ දක්වා ඇති නිර්මාණ සැලසුම්වලට අනුව ඉදිකරනු ලැබිය යුතුය.''*

5 වන නියෝගයේ දැක්වෙන්නේ;

*''5. යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලක්, ප්‍රසිද්ධ ස්ථානයක් හෝ පොදු සේවාවක් සහිත ස්ථානයක පහත දැක්වෙන යම් කොටසක්, රෝද පුටු, කිහිළිකරු සහ ඇවිදීමේ ආධාරක වැනි සංචරන උපකරණ භාවිත කරන තැනැත්තන්ට සහ වෙනත් තැනැත්තෙකුගේ සහාය ඇතිව ගමන් කරන තැනැත්තන්ට පහසුවෙන් ප්‍රවේශවීමට ඉඩ සලසාදීම සඳහා, මේ නියෝගවල II වන උපලේඛනයේ IIආ කොටසෙහි නිශ්චිතව දක්වා ඇති නිර්මාණ සැළසුම්වල අවශ්‍යතාවලට අනුව නිර්මාණය කරනු ලැබ තිබිය යුතුය:-*

1. *රථ ගාල් කිරීමේ ස්ථාන;*
2. *පෙත් මං සහ කොරිඩෝ;*
3. *බිම් මහල් සහ උඩු මහල්වල බිම මතුපිට;*
4. *පදික වේදිකා ප්‍රසිද්ධ පාරවල් සහා පදිකයන් මාරුවන ස්ථාන;*
5. *අත් වැටවල් හා ආධාරක පොලු;*
6. *පඩි සහ තරප්පු;*
7. *බෑවුම් සහිත ප්‍රවේශ මාර්ග;*
8. *විදුලි සෝපාන සහ ආරෝහක;*
9. *ප්‍රසිද්ධ ගොඩනැගිලිවල දොරටු හා ඇතුල්වන ස්ථාන;*
10. *වැසිකිලි;*
11. *උද්‍යාන, සත්වෝද්‍යාන, වෙනත් විනෝද වන ස්ථාන;*
12. *බස් නැවතුම්පොළවල්;*
13. *දුම්රිය නැවතුම්පොළවල්;*
14. *ජනෙල්, නිදන කාමර, බේසම්, මුළුතැන්ගෙය, ගබඩා කිරීමේ ස්ථාන, මේස, ස්විච් සහ පිටත උපාංග, ආලෝක සැපයුම් සහ සන්නිවේදන පද්ධතිය.''*

10 වන නියෝගයේ *"ප්‍රසිද්ධ ගොඩනැගිල්ල"* අර්ථ දක්වා ඇත්තේ:

"(i) සමූහ වාසස්ථාන සන මහල් නිවාස ඒකක සහ පේළි නිවාසවල පිහිටි කාර්ය මණ්ඩල වාසස්ථාන ද ඇතුළුව, නේවාසික කාර්ය සඳහා භාවිතා කරනු ලබන;

(ii) කාර්යාල ගොඩනැගිලි, හෝටල්, සංචාරක නේවාසික ස්ථාන, තානායම්, අමුත්තන්ගේ නිවාස සහ වෙනත් පොදු නවාතැන්පළවල්, සාප්පු සංකීර්ණ, සුපිරි වෙළෙඳසැල්, අවන්හල්, පොදු තොග හා සිල්ලර වෙළෙඳසැල් සහ රථගාල් ඇතුළු වාණිජ කාර්යය සඳහා භාවිත කරනු ලබන;

(iii) කර්මාන්තශාලා, වෙනත් වැඩපළවල් සහ ගබඩා ඇතුළු කාර්මික කාර්ය සඳහා භාවිතා කරනු ලබන;

(iv) අධ්‍යාපන ආයතන, පාසල්, රෝහල්, සාත්තු නිවාස, වෛද්‍ය මධ්‍යස්ථාන, බෙහෙත් ශාලා, වැඩිහිටි නිවාස, පන්සල්, පල්ලි, මුස්ලිම් පල්ලි සහ වෙනත් ආගමික ස්ථාන, පොලිස් ස්ථාන, අධිකරණ ශාලා, රැස්වීම් ශාලා, ග්‍රාම ශාලා, ප්‍රජා මධ්‍යස්ථාන, ශ්‍රවණාගාර, සම්මේලන ශාලා, පුස්තකාල, කෞතුකාගාර, ප්‍රදර්ශන ශාලා, පොදු වැසිකිලි සහ වෙනත් යම් ගොඩනැගිලි වැනි ප්‍රජා සමාජමය සහ අධ්‍යාපනික කාර්ය සඳහා භාවිත කරනු ලබන; සහ

(v) සිනමා ශාලා, නෘත්‍යාගාර, ප්‍රසංග ශාලා, ඔපෙරා ශාලා, කලාගාර, ක්‍රීඩාංගන, ක්‍රීඩා සංකීර්ණ, ක්‍රීඩා කරන ස්ථාන සහ වෙනත් විනෝදාංශ සඳහා භාවිත වන ස්ථාන වැනි විනෝදාත්ක කාර්ය සඳහා භාවිතා කරනු ලබන" ගොඩනැගිලි වශයෙනි.

එසේම, 10 වන නියෝගයේ *"පොදු සේවාව"* යන්න අර්ථ දක්වා ඇත්තේ පහත ආකාරයටය:

*"පොදු සේවාව යන්නෙන් -*

*(අ) පොදු ප්‍රවාහන සේවා සහ එම පොදු ප්‍රවාහන සේවාවලට සම්බන්ධ පහසුකම් අදහස් වන අතර, මගී ප්‍රවාහන බස් රථ, මගී ප්‍රවාහන දුම්රිය, බස් නැවතුම්පොළවල්, ඩිපෝ සහ පර්යන්ත දුම්රිය නැවතුම්පළවල්, මගී ප්‍රවාහන ගුවන් යානා, ගුවන් පර්යන්ත ගොඩනැගිලි සහ ගුවන් තොටුපොළවල් ඊට ඇතුලත් වේ; සහ*

*(ආ) පොදු සන්නිවේදන සේවා සහ එම සන්නිවේදන සේවාවලට සම්බන්ධ පහසුකම් අදහස් වන අතර, තැපැල් කාර්යාල, සන්නිවේදන මධ්‍යස්ථාන සහ දුරකථන කුටි ඊට ඇතුලත් වේ."*

අවසන් වශයෙන්, 10 වන නියෝගය "අදාළ අධිකාරිය" පහත පරිදි නිර්වචනය කරයි:

*""අදාළ අධිකාරිය" යන්නෙන් - යම් පළාත් පාලන අධිකාරියක් හෝ යම් ලිඛිත නීතියක් යටතේ යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අනුමත ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා*

*නැතහොත් පොදු වාහන සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යය සඳහා පත් කරන ලද යම් නිලධරයෙකු, තැනැත්තෙකු හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ."*

නියෝගවල I වන උපලේඛනය [I හා II කොටස්වලින් යුත්] පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන හා පොදු සේවාවන් සපයන ස්ථාන ඉදිකිරීමේ දී හෝ අලුත්වැඩියා කිරීමේ දී අනුගමනය කල යුතු නිර්මාණ සැලසුම් හා කාර්යසාධන පිරිවිතර දක්වයි. II වන උපලේඛනය [I හා II කොටස්වලින් යුත්] පොදු ප්‍රවාහනය සඳහා භාවිත කරන වාහන හා ආශ්‍රිත පහසුකම් සම්බන්ධයෙන් අනුගමනය කල යුතු නිර්මාණ සැලසුම් අවශ්‍යතා හා කාර්යසාධන පිරිවිතරයන් දක්වයි. අවසන් වශයෙන් III වන උපලේඛනය මඟින් දෘෂ්ටි ඌණතා ඇති තැනැත්තන් සඳහා වන ආරක්ෂක පියවර දක්වනු ලැබේ.

මෙම නඩු තීන්දුවේ අරමුණ සඳහා එම නිර්මාණ සැලසුම් හා කාර්යසාධන පිරිවිතරයන් විස්තර කිරීමේ අවශ්‍යතාවක් නොපවතී. නිදර්ශනයක් වශයෙන්: (i) 3(1) (a) නියෝගයේ දක්වා ඇති ආකාරයට I වන උපලේඛනයේ I කොටසේ ඇතුළුවීමේ හා පිටවීමේ ස්ථාන වල සිට ඉහළ පෙළේ මහල් නිවාස, තැපැල් කාර්යාල, බැංකු, මූල්‍ය සේවා ආයතන හා වෙළෙඳසැල් වෙත I වන උපලේඛනයේ IIආ කොටසේ දැක්වෙන නිර්මාණ සැලසුම් හා කාර්යසාධන පිරිවිතරයන්ට අනුකූල වන ආකාරයේ බෑවුමක් මඟින් ප්‍රවේශ වීමේ හැකියාව පැවතිය යුතු බවත්; සහ (ii) ප්‍රජා මධ්‍යස්ථාන, ග්‍රාම ශාලා, ශ්‍රවනාගාර, ප්‍රසංග ශාලා, රැස්වීම් ශාලා, සිනමාහල්, නෘත්‍යාගාර සහ පොදු මහජනතාව රැස්වන වෙනත් ස්ථාන ආබාධ සහිත තැනැත්තන් වෙත ප්‍රවේශය සැලසිය යුතු අතර I වන උපලේඛනයේ IIආ කොටසේ දැක්වෙන නිර්මාණ සැලසුම් හා කාර්යසාධන පිරිවිතරයන්ට අනුකූල ප්‍රවේශ පහසුකම් සහිත දොරටු හා වැසිකිළි පහසුකම් සැලසීම දැක්වීම ප්‍රමාණවත් වේ.

අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන හා නියෝග වෙත අවධානය යොමු කිරීමෙන් පසු, පනතේ සහ නියෝග වල අවශ්‍යතාවයන්ට අනුකූල නොවන පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන සහ පොදු සේවාවන් සපයන ස්ථාන ගණනාවක් පිළිබඳ පෙත්සම්කරුගේ පැමිණිල්ලට අදාළව පෙත්සම්කරු සහ වගඋත්තරකරුවන් විසින් අප ඉදිරියේ තබා ඇති කරුණු සලකා බැලිය යුතුය

එසේ කිරීමට පෙර, අප ඉදිරියේ ඇති අයදුම්පතේ විෂය කරුණු සම්බන්ධයෙන් නිරීක්ෂණය කිරීම යෝග්‍ය වනු ඇත, පනතේ ඉහත විධිවිධාන, නියෝග සහ ආබාධ සහිතභාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මඟින් පැහැදිලි කරනුයේ රජයේ යුතුකම වන ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම හා ඉහළනැංවීම සහ ඒ සඳහා ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් වැඩිදියුණු කිරීම සඳහා, රාජ්‍ය හා එහි නියෝජිත ආයතන අතර, පොදු ගොඩනැගිලි සහ පොදු පහසුකම් සැලසුම් කර ඉදිකර

ඇති බව සහතික කිරීම සඳහා ආබාධ සහිත පුද්ගලයින්ට පොදු පහසුකම් සාපේක්ෂ පහසුවකින් හා අනතුරකින් තොරව එවැනි පොදු ගොඩනැගිලිවලට ඇතුළුවීමට, පිටවීමට හා භාවිතා කිරීමට හැකි වන පරිදි සහතික කළ යුතුය.

පෙත්සම්කරු සිය සංශෝධිත පෙත්සමෙන් ඉල්ලා සිටියේ, නියෝග වල අවශ්‍යතාවයන්ට අනුකූල වීම සඳහා ලබා දී ඇති කාල සීමාව නිර්නය කර තිබියදීත්, *"... .. නියෝගවලට අනුකූල වීම තවමත් සාක්ෂාත් කර ගෙන නොමැති අතර එම නිසාවෙන් මෙම නව පෙත්සම."* ඔහු තවදුරටත් කියා සිටින්නේ *"...... ගරු විනිසුරුවරුන්ගේ අධිකරණ නියෝගයට අනුකූලව අඛණ්ඩව අපොහොසත් වීම පිළිබඳව සාමාන්‍ය ජනතාව මෙන්ම වෛද්‍ය වෘත්තිකයන් විසින් පැමිණිලි සහ දුක්ගැනවිලි ලැබීමෙන් පසු .......*

*ඉදිකිරීම් සහ පවත්නා ඉදිකිරීම් සඳහා තවත් වෙනස් කිරීම් කිහිපයක් සිදු කර ඇති අතර, විශේෂයෙන් වැසිකිළි, පියවර සහ රේල් පීලි සහ රම්ප් වල හඳුනාගෙන ඇති බොහෝ ගොඩනැගිලි කොටස්, කිසිසේත්ම ඉදිකර නොමැති හෝ වැරදි ලෙස ස්ථානගත කර හෝ ඒවායේ ඉදිකිරීම් වල බරපතල ගැටලු පවතින බවයි. එම පැමිණිලි වල නිරවද්‍යතාවය සලකා බැලීම සඳහා පෙත්සම්කරු සිය පුද්ගලික වියදමින් එම ස්ථාන නිරීක්ෂණය කර ඇත. 2006 ඔක්තෝබර් 17 දිනැති අංක 1,4657 ගැසට් පත්‍රයේ දක්වා ඇති අනිවාර්ය අවශ්‍යතා උල්ලංඝනය කරයි."* පෙත්සම්කරු සිය දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ, මහජනතාවගේ දුක්ගැනවිලිවළට  අවදානය යොමු කරමින්, *"මම පෞද්ගලිකව පිළිගත් රෝහල්, නගර හෝටල්, සුපිරි වෙළඳසැල් සහ සාප්පු සහ අධ්‍යාපන ස්ථාන වෙත ගොස් ඔවුන්ගේ මොරගැසීම්වල නිවැරදි බව නිරීක්ෂණය කර ඇත්තෙමි. ඔවුන්ගේ ජීවිතයේ ආරක්ෂාව පිළිබඳ භීතිය හඳුනා ගත්තෙමි. "* තවද, පෙත්සම්කරු සිය දිවුරුම් ප්‍රකාශයේ ප්‍රකාශ කර ඇත්තේ, 2011 අප්‍රේල් 27 දිනැති නියෝගය නොතකා, එස්.සී. ගොඩනැගිලි පනතේ විධිවිධාන හා නියෝග වලට අනුකූල නොවේ. ජොෂ්ඨ සහ කීර්තිමත් වෛද්‍ය වෘත්තිකයන් දෙදෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද "X3 (a)" සහ "X3 (b") ලෙස දිවුරුම් ප්‍රකාශ මගින් නව රෝහල් කිහිපයකට ප්‍රමාණවත් පරිදි ප්‍රවේශ පහසුකම්, වැසිකිළි හා රෙදි සෝදන පහසුකම් ලබා නොදෙන බව ඔවුන්ගේ පෞද්ගලික නිරීක්ෂණවලින් හෙළි වී ඇති බවයි. පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන ලද ඡායාරූප සහ වෙනත් ලියකියවිලි, කලින් සඳහන් කළ ප්‍රකාශයන්ට සහාය දක්වයි. පෙත්සම්කරු සිය සංශෝධිත පෙත්සමෙන් ඉල්ලා සිටියේ, නියෝග වල අවශ්‍යතාවයන්ට අනුකූල වීම සඳහා ලබා දී ඇති කාල සීමාව නිර්නය කර තිබියදීත්, *"... .. නියෝගවලට අනුකූල වීම තවමත් සාක්ෂාත් කර ගෙන නොමැති අතර එම නිසාවෙන් මෙම නව පෙත්සම."* ඔහු තවදුරටත් කියා සිටින්නේ *"...... ගරු විනිසුරුවරුන්ගේ අධිකරණ නියෝගයට අනුකූලව අඛණ්ඩව අපොහොසත් වීම පිළිබඳව සාමාන්‍ය ජනතාව මෙන්ම වෛද්‍ය වෘත්තිකයන් විසින් පැමිණිලි සහ දුක්ගැනවිලි ලැබීමෙන් පසු .......*

ඉදිකිරීම් සහ පවත්නා ඉදිකිරීම් සඳහා තවත් වෙනස් කිරීම් කිහිපයක් සිදු කර ඇති අතර, විශේෂයෙන් වැසිකිළි, පියවර සහ රේල් පීලි සහ රැම්ප් වල හඳුනාගෙන ඇති බොහෝ ගොඩනැගිලි කොටස්, කිසිසේත්ම ඉදිකර නොමැති හෝ වැරදි ලෙස ස්ථානගත කර හෝ ඒවායේ ඉදිකිරීම් වල බරපතල ගැටලු පවතින බවයි. එම පැමිණිලි වල නිරවද්‍යතාවය සලකා බැලීම සඳහා පෙත්සම්කරු සිය පුද්ගලික වියදමින් එම ස්ථාන නිරීක්ෂණය කර ඇත. 2006 ඔක්තෝබර් 17 දිනැති අංක 1,4657 ගැසට් පත්‍රයේ දක්වා ඇති අනිවාර්ය අවශ්‍යතා උල්ලංඝනය කරයි. " පෙත්සම්කරු සිය දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ, මහජනතාවගේ දුක්ගැනවිලිවළට  අවදානය යොමු කරමින්, *"මම පෞද්ගලිකව පිළිගත් රෝහල්, නගර හෝටල්, සුපිරි වෙළඳසැල් සහ සාප්පු සහ අධ්‍යාපන ස්ථාන වෙත ගොස් ඔවුන්ගේ මොරගැසීම්වල නිවැරදි බව නිරීක්ෂණය කර ඇත්තෙමි. ඔවුන්ගේ ජීවිතයේ ආරක්ෂාව පිළිබඳ භීතිය හඳුනා ගත්තෙමි. "* තවද, පෙත්සම්කරු සිය දිවුරුම් ප්‍රකාශයේ ප්‍රකාශ කර ඇත්තේ, 2011 අප්‍රේල් 27 දිනැති නියෝගය නොතකා, එස්.සී. ගොඩනැගිලි පනතේ විධිවිධාන හා නියෝග වලට අනුකූල නොවේ. ජ්‍යෙෂ්ඨ සහ කීර්තිමත් වෛද්‍ය වෘත්තිකයන් දෙදෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද "X3 (a)" සහ "X3 (b") ලෙස දිවුරුම් ප්‍රකාශ මගින් නව රෝහල් කිහිපයකට ප්‍රමාණවත් පරිදි ප්‍රවේශ පහසුකම්, වැසිකිළි හා රෙදි සෝදන පහසුකම් ලබා නොදෙන බව ඔවුන්ගේ පෞද්ගලික නිරීක්ෂණවලින් හෙළි වී ඇති බවයි. පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන ලද ඡායාරූප සහ වෙනත් ලියකියවිලි, කලින් සඳහන් කළ ප්‍රකාශයන්ට සහාය දක්වයි.

වගඋත්තරකරුවන් විසින් අප ඉදිරියේ තබා ඇති තොරතුරු වෙත හැරෙමු. "R2" සිට "R4", "R6" සිට "R12K" සහ "R20" ලෙස සලකුණු කර ඇති ලියකියවිලි වලින් දැක්වෙන්නේ 1, 4 සහ 8 වන වගඋත්තරකරුවන් උක්ත අවශ්‍යතාවය පිළිබඳ දැන සිටි බවයි. පනතේ සහ නියෝග වල අවශ්‍යතාවයන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා ඔවුන් යටතේ පාලනය වන හෝ ඔවුන් සමඟ කටයුතු කරනු ලබන පළාත් පාලන ආයතන, රජයේ දෙපාර්තමේන්තු, මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන, රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නිලධාරීන්ට උපදෙස් සහ චක්‍රලේඛ කිහිපයක් නිකුත් කරනලද බවයි.

අනතුරුව සලකුණු කර ඇති "R14" සිට "R18f" දක්වා ලේඛන අදාළ වනුයේ කොළඹ සැහැල්ලු දුම්රිය ප්‍රවාහන පද්ධතියක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය ගුවන් නගර සංවර්ධන ව්‍යාපෘතිය, කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය, මාකුඹුර බහුකාර්ය ප්‍රවාහන මධ්‍යස්ථානයේ සහ උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මහනුවර ව්‍යාපෘති කිහිපයකි. මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ සහ නාගරික සංවර්ධන අධිකාරියේ අනුග්‍රහය යටතේ නව මහා පරිමාණ ව්‍යාපෘති සැලසුම් කර ඇත්තේ යථෝක්ත වගකීම් සහ ආබාධ සහිත පුද්ගලයින්ට පනතේ විධිවිධාන හා නියෝගවලට අනුකූල වන පරිදි පහසුකම් සැපයීම රජයේ වගකීම හා යුතුකමය යන්න සිත් හි දරාගෙන බව මෙම ලිපි සහ ලේඛන මගින් සිත්ගන්නාසුළු ඇඟවුමක් ලබා දෙයි.

රජය සහ එහි නියෝජිතායතන විසින් සිදු කරනු ලබන හෝ රජය සහ එහි නියෝජිත ආයතන විසින් අනුමත කරනු ලබන අනෙකුත් සියලුම සමාන ව්‍යාපෘති එකම මාවතක් අනුගමනය කිරීම වැදගත්ය.
කෙසේ වෙතත්, එම ලිපි සහ ලේඛන අනාගතය සම්බන්ධයෙන් යම් තරමක සහතිකයක් ලබා දුන්නද, වර්තමානය ගැන කුමක් කිව හැකිද?

මේ සම්බන්ධයෙන්, ලංකා බැංකුව, තැපැල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ලියන ලද "R13a" ට "R13e" යනුවෙන් සලකුණු කර ඇති ලිපිවලින් තහවුරු වන්නේ මෙම පහසුකම් සැපයීමේ අවශ්‍යතාව මෙම රාජ්‍ය ආයතන දැනුවත්ව සිටින බවයි. පනතේ විධිවිධාන හා නියෝග වලට අනුකූල වන ඔවුන්ගේ පරිශ්‍ර සහ ප්‍රවාහන පද්ධති. ලංකා බැංකුව සහ විශේෂයෙන් තැපැල් දෙපාර්තමේන්තුව මෙම අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීමට උත්සාහ කර ඇති අතර ඔවුන් මුහුණ දුන් සීමාවන් තුළ සැලකිය යුතු සාර්ථකත්වයක් අත්කර ගෙන ඇති බව ද පෙනේ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ප්‍රවාහන මණ්ඩලය සහ ශ්‍රී ලංකා දුම්රිය සේවය යම් කාල සීමාවක් තුළ අනුකූලතාව සඳහා සැලසුම් කරමින් සිටින බව පෙනේ. සමස්තයක් වශයෙන්, "R13a" ලෙස "R13e" ලෙස සලකුණු කර ඇති ලිපිවලින් හෙළි වන්නේ පනතේ විධිවිධාන හා මෙම ආයතනවල පරිශ්‍රයන්හි සහ පොදු ප්‍රවාහන පද්ධති තුළ ඇති නියෝග වලට අනුකූල වීම සඳහා බොහෝ දේ කළ යුතු බවයි. නියෝග සම්පාදනය කර වසර ගණනාවක් ගතවී ඇතත්, පනතේ සහ නියෝග වල විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම තවමත් ක්‍රියාත්මක වෙමින් පවතින හෝ වැඩ ආරම්බ කිරීමට වඩා වැඩි නොවන බව පෙනේ.

රජයේ වෙනත් බොහෝ ආයතන සම්බන්ධයෙන් ද එම ස්ථාවරයම පවතිනු ඇතැයි අනුමාන කිරීම අසාධාරණ නොවේ.

ඇත්ත වශයෙන්ම, ආබාධ සහිතයන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය දී නිශ්චිතව සඳහන් කර ඇත්තේ:
*"පොදු ගොඩනැඟිලිවලින් බහුතරයක් රෝද පුටු භාවිතා කරන්නන්ට සහ සංචලතා ආබාධ සහිත සහ ඇවිදීමේ ආධාරක භාවිතා කරන අයට ප්‍රවේශ විය නොහැක. බොහෝ නාගරික සේවා ස්ථාන, අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතන සහ පොදු ගොඩනැගිලිවල පිවිසුම් දොරටු ඇත, බොහෝ විට ඒවා බහුකාර්ය වන අතර සෑම විටම සෝපාන නොමැත. රෝද පුටු වල සිටින අයට පොදු ප්‍රවාහනය භාවිතා කළ නොහැක. ග්‍රාමීය ප්‍රදේශවල බොහෝ මාර්ග තාර දමා නැති අතර බොහෝ විට අසමාන මතුපිටක් ඇත. බස් සේවා හිඟයි. නමුත් සේවා පවතින විට පවා බොහෝ පුද්ගලයින්ට ඒවා භාවිතා කළ නොහැකි වන්නේ ඒවා ප්‍රවේශ කළ නොහැකි බැවිනි - බස්රථවල උස, දොරවල් ඉතා පටු ය. සන්චලතා ආබාද සහිත පුද්ගලයන්ගෙන් 55%ක් හෝ ඊටත් අඩු පිරිසක් බස්රත බාවිතා කරති. 33%ක් දුම්රිය බාවිතා කරති. සියලුම ආබාධ සහිත කණ්ඩායම් එකට ගත් විට සංඛ්‍යා වඩා හොඳ නැත - බස් රථයෙන් ගමන් කරන්නේ 73% ක් වන අතර දුම්රියෙන් ගමන්කරන්නේ 45% ක් පමණි. ආබාධ සහිත බොහෝ පුද්ගලයින් (83%) ත්‍රීරෝද රථ කුලී රථ*

*භාවිතා කරති. එය අමතර වියදමකි. ප්‍රවාහනයට ඇති නොහැකියාව මෙම පුද්ගලයින් කණ්ඩායමට රැකියා සහ අධ්‍යාපන අවස්ථා දැඩි ලෙස සීමා කරයි. ආබාධ සහිත පුද්ගලයින්ට භාවිතා කළ නොහැකි ප්‍රවේශ ස්ථාන අතර බැංකු සහ ආගමික නමස්කාර ස්ථාන තිබේ. පටු ද්වාර සහ සවිකෘත නිසා බොහෝ පොදු ගොඩනැගිලි, හෝටල්, විවේකාගාර, සිනමා ශාලා, සිනමාහල්, පාසල් ආදියෙහි වැසිකිළිවළට ප්‍රවේශ විය නොහැක.*

ආබාධ සහිතභාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2003 දී ඉහත නිරීක්ෂණ සිදු කර වසර 16 ක් ගතවී ඇතත් නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවන්ට අනුකූලව මණ්ඩලය තුළ නියෝගවළට අනුකූලතාව පැහැදිලි දියුණුවක් ඇති බවට යෝජනා කරන කිසිදු තොරතුරක් අප ඉදිරියේ නොමැත.

මෙම තත්ත්වයන් තුළ, එළඹිය හැකි නොවැළැක්විය හැකි නිගමනය නම්, පනතේ සහ නියෝග වල විධිවිධාන සැලකිය යුතු ලෙස අනුකූල නොවීම සහ බලාත්මක නොකිරීම ය.

නියෝග විමසා බැලීමෙන් කෙනෙකුට නියෝග විස්තීර්ණ හා පහසුවෙන් තේරුම් ගත හැකිය යන හැඟීම ඇති වේ. නියෝග සකස් කර ඇත්තේ අසාධාරණ දුෂ්කරතා හෝ දරාගත නොහැකි වියදමක් නොකර අනුකූලතාවයට ඉඩ සලසන අයුරිනි, විශේෂයෙන් නව ඉදිකිරීම් සහ නව අත්පත් කර ගැනීම් වලදී. වෙනත් වචන වලින් කිවහොත්, නියෝග මගින් රාජ්‍ය පාර්ෂවයන් ට එක්සත් ජාතීන්ගේ සංවිධානයට නිර්නය කර ඇති "*සාධාරණ නවාතැන්*" වල මිණුම් ලකුණ ඉක්මවා යන ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය නොවන අතර එක්සත් ජාතීන්ගේ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සම්මුතියේ 2 වන වගන්තියේ අර්ථ දක්වා ඇත්තේ:

*"යම් අවස්ථාවක දී අවශ්‍ය වූ විට, අසමාන හෝ අනවශ්‍ය බරක් පැටවීමකින් තොරව අවශ්‍ය හා සුදුසු වෙනස් කිරීම් හා ගැළපීම්, ආබාධ සහිත පුද්ගලයින්ට ද සෙසු අය හා සමාන පදනමක් මත සියලු මානව හිමිකම් සහ මූලික නිදහස, හෝ විනෝදය සහතික කිරීම ට කටයුතු කළ යුතු බව;"* යි.

මේ අනුව, පැහැදිලි සත්‍යය නම්, නියෝග සකස් කර වසර 13 ක් පමණ ගතවී තිබියදීත්, අනුකූල වීමට ඉඩ දී ඇති කාල සීමාව ඉකුත්වී වසර එකහමාරකට වැඩි කාලයක් ගතවී තිබියදීත්, නියෝගවලට අනුකූල නොවීම විශාල වශයෙන් සිදුවී ඇති බවයි. .

මම ෂේක්ස්පියර්ගේ ජුලියස් සීසර් [ I ජවනිකාවේ II වන දර්ශනයේ 140-141] පේළීන් හි කැෂියස් ගේ වචන සන්න කරනවා ඉදිරිපත් කරන්නේ නම්.

එහි වැරැද්ද පවතින්නේ නියෝගවල නොව, රජය සහ එහි නියෝග වලට අනුකූලව වන බව ය. අසල්වැසි ඉන්දියාවේ ද එවැනිම ගැටලුවක් පවතින බව පෙනේ.

එවැනි ආබාධ සහිත පුද්ගලයින්ගේ අභිවෘද්ධිය සඳහා ඉන්දියාව විවිධ නීති හා යෝජනා ක්‍රම ඉදිරිපත් කර ඇතත් නීති සහ යථාර්ථය අතර පරතරය තවමත් පවතී.

නියෝගවලට දැඩි ලෙස අනුකූල නොවීම, තුළින් පෙත්සම්කරුගේ හා ඒ හා සමාන තත්ත්වයකට පත්ව සිටින ආබාධ සහිත පුද්ගලයන්ගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) සහ 14 (1) ()) වගන්තිය මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර තිබේ ද යන ප්‍රශ්නයට මම දැන් අවධානය යොමු කරමි. නියෝගවලට දැඩි ලෙස අනුකූල නොවීම, තුළින් පෙත්සම්කරුගේ හා ඒ හා සමාන තත්වයකට පත්ව සිටින ආබාධ සහිත පුද්ගලයන්ගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) සහ 14 (1) (උ)) වගන්තිය මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර තිබේද යන ප්‍රශ්නයට මම දැන් අවධානය යොමු කරමි.

මේ සම්බන්ධව, කලින් සඳහන් කළ පරිදි, ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 9% ක් පමණ ආබාධ සහිත බව ඇස්තමේන්තු කර ඇත. ඔවුන් අතර රණවිරුවන්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්,

සිසුන් සහ වෙනත් අය. වෙති. පෙත්සම්කරු මෙම කණ්ඩායමේ සාමාජිකයෙකි. ශ්‍රී ලංකාවේ තවත් මිලියන දෙකකට ආසන්න සංඛ්‍යාවක් ආබාධ සහිත පුද්ගලයන් සිටින අතර ඔවුන් එම පුළුල් කාණ්ඩයට අයත් වේ. පනතේ සහ නියෝග වල විධිවිධාන සතුටුදායක ලෙස ක්‍රියාත්මක කිරීමට හා බලාත්මක කිරීමට රජය සහ එහි නියෝජිතායතන විසින් ඉහත අසමත් වීම පෙත්සම්කරුට සහ ආබාධ සහිත පුද්ගලයින්ට සැලකිය යුතු අගතියක් ඇති කර ඇති බවට සැකයක් නැත. පොදු ස්ථාන, පොදු ස්ථාන සහ පොදු සේවාවන් ඇති ස්ථානවලට ප්‍රවේශ වීම සහ මෙම ස්ථාන තුළ ඇති පහසුකම් භාවිතා කිරීම ට දුෂ්කරතා මතුව ඇති අතර එවැනි ස්ථානවලට පිවිසීමේදී ඇතැම් විට තුවාල වීමේ අවදානමට ලක්ව ඇත.

මීට පෙර SC FR අයදුම්පත් අංක 221/2009 හි වාර්තාවෙන් සහ 2011 අප්‍රේල් 27 දිනැති නියෝගයෙන් වගඋත්තරකරුවන්ගේ කැමැත්ත මත මෙම නියෝගය පදනම් වී නොමැති බව පැහැදිලිය. මේ අනුව, නියෝගය ඉදිරිපත් කිරීමේදී, මෙම අධිකරණය නිසැකවම ඉදිරියට ගියේ පෙත්සම්කරු විසින් වෙනස්කොට සැලකීම සහ ඔහුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් තහවුරු කර ඇති පදනම මත ය. වර්තමාන යෙදුම සැසඳිය හැකි කරුණු මත ය. තව දුරටත්, වසර කිහිපයක් ගතවී තිබියදීත් පනත හා නියෝග වලට අනුකූලව කටයුතු නොකිරීම එම තත්ත්වය තවත් උග්‍ර කරන අතර පෙත්සම්කරුගේ වර්තමාන පැමිණිල්ලට විශාල බලයක් ලබා දෙයි. කලින් සඳහන් කළ පරිදි, පනත, නියෝග සහ නියෝගයට අනුකූල නොවන්නේ නම්, නව අයදුම්පතක් ඉදිරිපත් කිරීමේ අයිතිය පෙත්සම්කරුට SC FR අයදුම්පත් අංක221/2009 හි පැහැදිලිවම ලබා දී ඇත.

මෙම තත්ත්වයන් යටතේ, වර්තමාන අයදුම්පත්‍රයේ දී ද අප ඉදිරියේ තබා ඇති සහ කලින් සඳහන් කළ කරුණු අනුව පෙත්සම්කරුට ඔහුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට ප්‍රකාශයක් සඳහා හිමිකම් ඇති බවට නිගමනයකට එළඹීමට මට තවත් කරුණු අවශ්‍ය නොවේ.

කෙසේ වෙතත්, පනතේ සහ නියෝග වල විධිවිධාන සතුටුදායක ලෙස ක්‍රියාත්මක කිරීමට හා බලාත්මක කිරීමට රජය සහ එහි නියෝජිත ආයතන අසමත්ව තිබීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති ආකාරය තවදුරටත් සලකා බැලීම ප්‍රයෝජනවත් වනු ඇත.

එසේ කරන විට, එක්සත් ජාතීන්ගේ ආවබාද සහිත තැනත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය ශ්‍රී ලංකාව විසින් අත්සන් කොට අපරාඅනුමත කරන ලද බව මතක තබා ගත යුතුය. එම සම්මුතියෙහි 3 (ඊ) වගන්තිය ප්‍රකාශ කරන්නේ එහි පොදු මූලධර්ම අතෙන් එකක් "*ප්‍රවේශ්‍යතාව*" බවයි.
ඉන්පසුව, උක්ත සම්මුතියෙහි 9 (1) වන වගන්තිය මගින් ප්‍රකාශයට පත්කර ඇත්තේ සියලුම රාජ්‍ය පාර්ෂවකරුවන් විසින්:

*"... .. ආබාධ සහිත පුද්ගලයින්ට, අනෙක් අය සමඟ සමාන පදනමක් මත, භෞතික පරිසරයට, ප්‍රවාහනයට, තොරතුරු වලට සහ*
*තොරතුරු, සන්නිවේදන තාක්ෂණයන් සහ පද්ධති ඇතුළුව සන්නිවේදනයන් සහ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල මහජනයාට විවෘත හෝ සපයනු ලබන වෙනත් පහසුකම් හා සේවාවන්... .. "*ලෙස ය.

පාර්ලිමේන්තුව විසින් ඒ සඳහා බලපැවැත්වෙන පරිදි නීති සම්පාදනය කරන තෙක් එක්සත් ජාතීන්ගේ සංවිධානය අත්සන් කර අනුමත කරන විට රජය විසින් ලබා දී ඇති මෙම කාර්යය අපේ රටේ නීතියට සමාන නොවන බවට සැකයක් නැත.

එසේ වුවද, ශ්‍රී ලංකාව විසින් මෙවැනි ආකාරයේ ජාත්‍යන්තර සම්මුතීන් "*මෘදු නීතියක්*" ලෙස සකස් කර ඇති බව මෙම අධිකරණය පිළිගෙන ඇති අතර, මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් විධායක හෝ පරිපාලනමය ක්‍රියාමාර්ග සහ අකාර්යක්ෂමතාව සමාලෝචනය කිරීමේදී සැලකිල්ලට ගත හැකිය. - බලන්න: බුලන්කුලමා එදිරිව. කාර්මික සංවර්ධන අමාත්‍යාංශය [2000 3 ශ්‍රී ලංකා නීති වාර්තා 243, පි. 274], විජේබන්ඩා එදිරිව. වෙරළ සන්රක්ෂන ජෙනරල් [2009 1 ශ්‍රී ලංකා නීති වාර්තා 337 පි. 359] සහ ඔතකදී තීරනය වූ කාරියවසම් එදිරිව. මද්‍යම පරිසර අධිකාරිය [SC FR 141/2015 decided on 04th April 2019].

මෑත කාලීන නඩු තිරනයක් වන ජීජා ගෝෂ් එදිරිව ඉන්දියානු සමූහාන්ඩුව හි දී ආබාධ සහිත අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියාකාරිනියක වන පෙත්සම්කාරිය ට මාස්තිශ්ක ආඝාතය ඇති බැවින් වාණිජ ගුවන්

සමාගමකින් ඇයව ඉවත් කරන ලදී. එය ප්‍රකාශයට පත් කරන ලද සිවිල් ගුවන් සේවා අවශ්‍යතා උල්ලංඝනය කිරීමකි. පෙත්සම්කාරිය විසින් ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණයේ මැදිහත්වීම ඉල්ලා සිටියේ ලිඛිතව හා උපදෙස් මගින් වගඋත්තරකරුවන්ට අදාළ "*සිවිල් ගුවන් සේවා අවශ්‍යතාවයන්ට*" අනුකූල විය යුතු බවයි. ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය පෙත්සම්කාරිය සම්බන්ධයෙන් අදහස් දක්වමින් 39]:[ඡේදයේ දී මෙසේ ප්‍රකාශ කළේ ය.

*"ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ දී සමානාත්මතාවය පදනම් වී ඇත්තේ අනුපූරක මූලධර්ම දෙකක් මත ය: වෙනස් කොට සැලකීම සහ සාධාරණ විශේෂණයවෙනස් කොට සැලකීමේ මූලධර්මය උත්සාහ කරන්නේ සියළුම පුද්ගලයන්ට ඔවුන්ගේ සියලු අයිතිවාසිකම් සහ නිදහස සමානව භුක්ති විඳීමට හා ක්‍රියාත්මක කිරීමට හැකි බව සහතික කිරීමට ය. සමාන සහභාගීත්වයක් සඳහා ඇති අවස්ථාවන් අත්තනෝමතික ලෙස ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් වෙනස්කම් කිරීම සිදු වේ. නිදසුනක් වශයෙන්, ආබාධ සහිත පුද්ගලයින්ට ළඟාවිය නොහැකි ප්‍රමිති මත පොදු පහසුකම් සහ සේවාවන් සකසා ඇති විට, එය අයිතිවාසිකම් බැහැර කිරීමට හා ප්‍රතික්ෂේප කිරීමට මග පාදයි. සමානාත්මතාවය යන්නෙන් අදහස් කරන්නේ වෙනස් කොට සැලකීම වැළැක්වීම (නිදසුනක් ලෙස වෙනස් කොට සැලකීම් විරෝධී නීති හඳුන්වා දීමෙන් අයහපත් ලෙස සැලකීමට එරෙහිව පුද්ගලයින් ආරක්ෂා කිරීම) පමණක් නොව, සමාජයේ ක්‍රමානුකූලව වෙනස් කොට සැලකීම්වලට ලක්වන කණ්ඩායම්වලට එරෙහි වෙනස්කම්වලට පිළියම් යෙදීම ඉක්මවා යාමයි. සංක්ෂිප්තව ගත් කල, එයින් අදහස් කරන්නේ ධනාත්මක අයිතිවාසිකම්, සහතික කිරීමේ ක්‍රියාමාර්ග සහ සාධාරණ නවාතැන් යන සංකල්පය වැලඳ ගැනීමයි. වෛද්‍ය ආකෘතියෙන් නියෝජනය වන ආබාධ සහිත පුද්ගලයින් සඳහා සමාන අයිතිවාසිකම් ඇති ප්‍රජාවේ සාමාජිකයන් ලෙස සැලකීම සඳහා අනුග්‍රහය දැක්වීමේ හා පීතෘමූලික ප්‍රවේශයේ සිට, විශේෂයෙන් ආබාධ සහිත පුද්ගලයින්ට අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් පරිණාමය වීම මෙන්ම, විශ්ව මානව හිමිකම් කාණ්ඩය තුළ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිය. "*[අවධාරණය එකතු කරන ලදි].

ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කළේ:[42]ඡේදයේදී]

*ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ මාතෘකාව මානව හිමිකම් දෘෂ්ටි කෝණයෙන් විමසිය යුතු අතර, එමඟින් ආබාධ සහිත පුද්ගලයින්ට ජාත්‍යන්තර වශයෙන් සහතික කළ අයිතිවාසිකම් සහ නිදහස පිළිබඳ පූර්ණ පරාසයක් භුක්ති විඳීමට අයිතියක් ඇති බව හඳුනාගෙන තිබේ.*

යථාර්ථයේ දී ආබාධ සහිත පුද්ගලයින්ට එම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි ධනාත්මක ක්‍රියාමාර්ග ගැනීමට මෙය රාජ්‍යයන්ට වගකීමක් ජනිත කරයි. ආබාධ සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් පොදු මානව හිමිකම් ප්‍රමිතීන් සම්පූර්ණයෙන් මැනිය යුතු බවට අවධාරනය කළ යුතු අතරම, එම පොදු ඇපකරයන්ට සවිස්තරාත්මක සන්දර්භ අන්තර්ගතයන් පිරිපහදු කොට ලබා දෙන විශේෂිත උපකරණ

සංවර්ධනය කිරීම ද කළ යුතුය. ආබාධ සහිත පුද්ගලයින් ප්‍රජාවේ අනිවාර්ය අංගයක් වූ අතර ගෞරවාන්විතව සමාන වූ අතර අනෙක් අයට සමාන මානව හිමිකම් හා නිදහස භුක්ති විඳීමට සුදුසුකම් ඇති බව පූර්ණ පිළිගැනීමක් තිබිය යුතුය. [අවධාරණය එකතු කරන ලදි].

ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණයේ මෙම වචන මගින් ආබාධ සහිත පුද්ගලයින්ට එදිනෙදා ජීවත්වීමට අවස්ථාව ලබා දිය යුතු බවට වන රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අපගේ පනතේ සහ නියෝග වල ඉහත විධිවිධාන පවතින බවයි. ප්‍රජාවේ අනෙක් අය සමඟ සමානාත්මතාවයේ වේදිකාවක දිවා ජීවිතය ගත කරන අතර, පනතේ සහ නියෝග වල ඉහත විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා අනුකූල වීම සහතික කිරීම රජය සහ එහි නියෝජිත ආයතන වෙත පැවරී ඇති යුතුකමකි යන මෙම තීන්දුවේදී මා විසින් සිදුකරන ලද නිරීක්ෂණය ශක්තිමත් කරයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (4) ව්‍යවස්ථාවේ අධිකාරිය යටතේ පනත සහ නියෝග නීතිගත කර ඇති අතර ඒවා සහතික කිරීමේ ක්‍රියාමාර්ගයක් මගින් සිදු කර ඇති බව පැහැදිලිය. එම කාර්යීය විශේෂ විධිවිධාන නීතියෙන්, අනු නීතිවලින් හෝ සිදුකළ හැකි බව පිළිගනී. විධායක ක්‍රියාමාර්ග, කාන්තාවන්, ළමුන් හෝ ආබාධ සහිත පුද්ගලයින්ගේ අභිවෘද්ධිය සඳහා. සිදුකළ හැකි බව රම්පිල්ලේ එ. පෙරේරා [1991 1 ශ්‍රී ලංකා නීති වාර්තා 11 p.13]නඩුතීන්දුවේදී ප්‍රනාන්දු විනිසුරුවරයා පහත නිරීක්ෂණය සිදුකරන ලදි.

12 වන ව්‍යවස්ථාවේ (2), (3) සහ (4) ඡේදයන් මූලික වශයෙන් සමානාත්මතාවයේ මූලධර්මය පැහැදිලි කිරීම සහ ප්‍රකාශ කිරීම වන අතර එම මූලධර්මයට කිසිවක් එකතු කිරීම හෝ අඩුනකිමක් සිදුනොවේ. 12 (4) වගන්තිය විශේෂයෙන් කාන්තාවන්, ළමුන් සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා '*සහතික කිරීමේ ක්‍රියාමාර්ගයක්*' සඳහා අවසර දී නැත, නමුත් ඔප්පු කළ '*අසමානතාව*' හැරුණු විට;බොහෝ පරිස්සමෙන්, 12 වන වගන්තියේ කිසිවක් ස්ථිර කිරීමේ ක්‍රියාමාර්ග වළක්වනු නොලබන බව ප්‍රකාශ කරයි;

කලින් නිරීක්ෂණය කළ පරිදි, පනත බලාත්මක කර, ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කොට, නියෝග සකස් කර ඇති අතර, ආබාධ සහිත පුද්ගලයින්ට ඔවුන්ගේ එදිනෙදා ජීවිතය අන් අය සමඟ සම බිමක් තුළ සිටිමින් ජීවත්වීමට අවස්ථාව ලබා දීම සඳහා පනතේ විධිවිධාන හා නියෝග වලට අනුකූලව කටයුතු කිරීම හා සහතික කිරීම රාජ්‍යයට සහ එහි නියෝජිතායතනවලට යුතුකමක් වේ.

කෙසේ වෙතත්, අප ඉදිරියේ තබා ඇති කරුණු වලින් පෙනී යන්නේ පනතේ සහ නියෝග වල විධිවිධාන සතුටුදායක ලෙස ක්‍රියාත්මක කිරීමට, අනුකූල වීමට හා බලාත්මක කිරීමට රජය සහ එහි නියෝජිතායතන විසින් අසමත් වී ඇති බවයි. රජයේ සහ එහි නියෝජිතායතනවල මෙම අසාර්ථකත්වය පෙත්සම්කරුට හා ඒ හා සමාන තත්වයක් ඇති අයට, පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන සහ පොදු සේවාවන් ඇති ස්ථාන වෙත පිවිසීමට සහ මෙම ස්ථාන තුළ ඇති පහසුකම් භාවිතා කිරීමට ඔවුන්ට ඇති හැකියාව එදිනෙදා ජීවිතයට

ප්‍රජාව තුළ අන් අය සමඟ සමානාත්මතාවයේ වේදිකාවක් මත ජීවත්වීමේ අවස්ථාව අහිමි කර ඇති බව එයින් කියවේ.. තවද, එම අසාර්ථකත්වය රජය සහ එහි නියෝජිතායතන විසින් සිදු කර ඇත පෙත්සම්කරු සහ ඒ හා සමාන තත්ත්වයක් ඇති වෙනත් අයට, පනතේ විධිවිධාන හා නියෝග මගින් ඔවුන්ට ලබා දී ඇති ආරක්ෂාව, පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන සහ පොදු සේවාවන් ඇති ස්ථානවලට ප්‍රවේශ වීමට සහ ඒවා තුළ ඇති පහසුකම් භාවිතා කිරීමට ඇති හැකියාව අහිමි කර තිබේ.

ඒ අනුව, පනතේ විධිවිධාන සහ නියෝග සතුටුදායක ලෙස ක්‍රියාත්මක කිරීමට, ඒවාට අනුකූලව හා බලාත්මක කිරීමට රජය සහ එහි නියෝජිතායතන විසින් අපොහොසත් වීම මගින් පෙත්සම්කරු සහ ඒ හා සමාන තත්ත්වයක් ඇති වෙනත් අයට එම අවස්ථාව අහිමිකිරීම සහ අහිමි කිරීම අඛණ්ඩව සිදුකරන බව මම විශ්වාස කරමි. පනතේ සහ නියෝග වල විධිවිධාන මගින් ඔවුන්ට ලබා දී ඇති සමානාත්මතාවය සහ ආරක්ෂාව සහ එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම්කරුට සහ ඒ හා සමාන තත්වයක සිටින අනෙක් අයගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇත.

මගේ මතය අනුව, මෙම අයදුම්පත සම්බන්ධයෙන් මතය ඉදිරිපත් කිරීමේ අරමුණු සඳහා ඉහත තීරණය කිරීම ප්‍රමාණවත් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (ඌ)) අනුව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇත්දැයි සලකා බැලීම සඳහා තවදුරටත් ඉදිරියට යා යුතු නැත.

නිකුත් කළ යුතු නියෝග හා මඟ පෙන්වීම් දැක්වීමට පෙර, සෑම මිනිසෙකුගේම හිමිකම වන මානව ගරුත්වය පිළිබඳ සංකල්පය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති අයිතිවාසිකම්වල මූලික හරය බවත් අපේ රටේ සියලු ජනතාවගේ ආරක්ෂාව සඳහා මෙම මූලික අයිතිවාසිකම් පැන නැගී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ පෙළ ගැසී සිටින උල්පත ලෙස මා හට පෙනී යන බවත් සඳහන් කිරීමට කැමැත්තෙමි, හිටපු ඊශ්‍රායිල අග්‍රවිනිෂ්චයකාරවරයෙකු වන අහරොන් බරක් [මානව ගරුත්වය - ව්‍යවස්ථාමය වටිනාකම සහ ව්‍යවස්ථාමය අයිතිය (2015)] තුළ අදහස් දක්වමින් ප්‍රකාශ කොට ඇත්තේ:

*“මානව හිමිකම් පැවැත්මේ කේන්ද්‍රීය තර්කය මානව ගරුත්වයයි. එය සියලු හිමිකම් වළ පදනම් තර්කයයි. එය අයිතිවාසිකම් පැවතීම සාධාරණීකරණය කිරීමයි. ”* සහ *“මානව ගරුත්වයේ ව්‍යවස්ථාමය වටිනාකමට කේන්ද්‍රීය සම්මත භූමිකාවක් ඇත. ව්‍යවස්ථාමය වටිනාකමක් ලෙස මානව ගරුත්වය යනු මානව හිමිකම් එකකට එකමුතු කරන සාධකයයි. එමඟින් මානව හිමිකම්වල සම්මත එක්සත්කම සහතික කෙරේ”* යනුවෙනි.

"*නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය*" යනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව දක්වන විට මා හට පෙනී යන්නේ එය ආබාධ සහිත

තැනැත්තන්හට පනතේ ප්‍රතිපාදන හා නියෝග සතුටුදායක මට්ටමකින් අනුගමනය කිරීමටත්, ක්‍රියාත්මක කිරීමටත් රජයේ හා රජයේ නියෝජිතායතන පාර්ශවයෙන් සිදු වන පනතේ ප්‍රතිපාදන හා නියෝග වල ආරක්ෂාව ආබාධ සහිත තැනැත්තන් වෙත ලබා දීම ප්‍රතික්ෂේප කරන ආකාරයේ හා පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන හා පොදු පහසුකම් සපයනු ලබන ස්ථාන වලට ප්‍රවේශ වීමේදී හා එම පහසුකම් ලබා ගැනීමේ දී සමාජයේ අන් අයගෙන් වෙනස් තත්වයක ඔවුන් පිහිටුවනු ලබන ආකාරයේ අත්තනෝමතික හෝ අසාධාරණ අපොහොසත් වීම් වලට එරෙහිව ආරක්ෂාව ලැබීමේ හිමිකම් ලබාදෙන බවයි. එසේම, රජයේ හා රජයේ නියෝජිතායතන වල අසාර්ථකත්වය හේතුවෙන් ආබාධ සහිත තැනැත්තන්ට පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන හා පොදු සේවා සපයන ස්ථානයන්ට ප්‍රවේශ වීම වැළකීම හා එම ස්ථාන වලට පිවිසීමටත්, එම පහසුකම් ලබා ගැනීමටත් ආබාධ සහිත තැනැත්තන් දරන උත්සාහයේ දී ඔවුන්ට ප්‍රසිද්ධියේ දුෂ්කරතාවන්ට, අසීරුතාවන්ට හා බියට මෙන්ම ඇතැම් විට ප්‍රසිද්ධියේ අපහසුතාවට හා නින්දාවට ලක් වීමට පවා සිදු වීමත් ඉන් ඔවුන්ගේ මානව ගරුත්වය බරපතළ ලෙස හානියට පත්වීමට ඇති ඉඩත් පිළිබඳව කිසිඳු ආකාරයක මතභේදයක් පැවතිය නොහැකිය. මෙම ප්‍රත්‍යක්ෂ සත්‍යයෙන් පැහැදිලි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් පෙත්සම්කරුට හා ඒ හා සමාන තත්වයක සිටින සෙසු පුද්ගලයන්ට සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදු වී ඇති බවත් තවදුරටත් එසේ සිදුවෙමින් පවතින බවත්ය.

මෙහිදී පනතේ 24 (1) වන වගන්තිය කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය. එම වගන්තියේ දැක්වෙන ආකාරයට:

*"23 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් සිදුකොට ඇති අවස්ථාවක දී, ඒ උල්ලංඝනය කිරීම බලපානු ලැබූ තැනැත්තා පදිංචිව සිටින ප්‍රදේශය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 . ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය වෙත, සහනය හෝ ප්‍රතිකර්ම පතා ඉල්ලීමක්, එසේ බලපානු ලැබූ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තා වෙනුවෙන් සභාව විසින් හෝ ඉදිරිපත් කරනු ලැබිය හැකිය."*

එසේම 24 (3) වගන්තියේ දැක්වෙන ආකාරයට:

*"(1) වන ඡේදයේ සඳහන් යම් ඉල්ලීමක් සම්බන්ධයෙන්, අවස්ථාගත කරුණු අනුව සාධාරණ හා සාධාරණීය යයි මහාධිකරණය විසින් සලකනු ලබන සහන ප්‍රදානය කිරීමේ හෝ විධාන නිකුත් කිරීමේ බලය, මහාධිකරණයට ඇත්තේය."*

තවද, පනතේ 34 (ඉ) වගන්තිය ප්‍රකාරව:

*"මේ පනතේ, විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් හෝ රීතියක් කඩ කළ හොත්,*

*ඒ තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ එක්*

*අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වන්නේ ය."*

35 වන වගන්තිය දක්වන ආකාරයට: මෙම පනත යටතේ යම් වරදක් පුද්ගලයන් මණ්ඩලයක් විසින් සිදු කරන ලද අවස්ථාවකදී එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වනවිට එම සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරක්ම, ලේකම්වරයෙක්ම සහ නිලධරයෙක්ම එම වරදට වරදකරුවන් වශයෙන් සලකනු ලබන අතර එම පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම් එම ව්‍යාපාර ආයතනයේ සාම හවුල්කාර හවුල්කරුවෙකුම එම වරදට වරදකරුවෙකු වශයෙන් සැලකිය යුතුය.

පනතේ ඇතුලත් මෙම විධිවිධාන උපයෝගී කරගෙන ඇති බව ප්‍රකාශ කරන ආකාරයේ සාක්ෂි කිසිවක් අප වෙත නොමැත. පනතේ ප්‍රතිපාදන හා නියෝගවලට අනුකූල වීම තහවුරු කිරීමේ සිය උත්සහයන්හිදී ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව, ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය සහ සෙසු වගඋත්තරකරුවන්ගේ අවධානය පනතේ ඉහතින් දක්වන ලද ප්‍රතිපාදන වෙත යොමු කිරීම සුදුසු බව අපගේ හැඟීමයි.

අවසාන වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් පෙත්සම්කරුට හා ඒ හා සමාන තත්ත්වයක සිටින සෙසු පුද්ගලයන්ට සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් 1 සිට 8 දක්වා වගඋත්තරකරුවන්ගේ විෂය පථයට හෝ පාලනයට යටත් නියෝජිතායතන ඇතුළුව රජය හා රජයේ නියෝජිතායතන පාර්ශවයෙන් සිදු වී ඇති බව ප්‍රකාශ කරමු.

මැතකදී සම්පූර්ණ කරන ලද හෝ තවමත් ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම හා යම් යම් උපදෙස් ලබා දීම හැරුණු විට තමාගේ විෂය පථය හෝ පාලනය යටතේ හෝ පළාත් පාලන ආයතන, රජයේ දෙපාර්තමේන්තු හෝ මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන හා 1 සිට 8 දක්වා වගඋත්තරකරුවන් යටතේ පවතින රජයේ නියෝජිතායතන යටතේ පවතින සියලුම පරිශ්‍රයන් හා පහසුකම් සම්බන්ධයෙන් පනතේ ප්‍රතිපාදන හා නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් 1 සිට 8 දක්වා වගඋත්තරකරුවන් අප වෙත කරුණු සපයා නොමැති බව මෙහිදී සඳහන් කල යුතුය.

සංශෝධිත පෙත්සමේ (ආ) ඉල්ලීම යටතේ යාචනය කරන ලද සහනය සම්බන්ධයෙන්:

(i) 1 සිට 8 දක්වා වගඋත්තරකරුවන්ගේ විෂය පථය හෝ පාලනය යටතේ හෝ පළාත් පාලන ආයතන, රජයේ දෙපාර්තමේන්තු හෝ මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන හා 1 සිට 8 දක්වා වගඋත්තරකරුවන් යටතේ පවතින රජයේ නියෝජිතායතන යටතේ පවතින පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන හා පොදු සේවාවන් සපයන ස්ථාන [2006 අංක 1 දරණ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග වල 10 වන නියෝගයේ අර්ථ නිරූපණය කර ඇති

ආකාරයට] සම්බන්ධයෙන් සංශෝධිත 2006 අංක 1 දරණ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග වහාම ක්‍රියාත්මක කිරීමට හා අනුගමනය කිරීමට 1 සිට 8 දක්වා වගඋත්තරකරුවන්ට සහ 1 සිට 6 දක්වා වගඋත්තරකරුවන්ගේ අමාත්‍යාංශවල ලේකම්වරුන්ට මෙයින් නිර්දේශයක් නිකුත් කරනු ලැබේ,.

කෙසේ වෙතත්, පවත්නා පොදු ගොඩනැගිල්ලක, පොදු ස්ථානයක් සහ පොදු සේවාවන් සපයන ස්ථානයක [2006 අංක 1 දරණ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග වල 10 වන නියෝගයේ අර්ථ නිරූපණය කර ඇති ආකාරයට] එසේ ප්‍රතිපාදන හා නියෝග ක්‍රියාත්මක කිරීමේ දී හා ඊට අනුකූල වීමේ දී වලංගු ප්‍රායෝගික සහ / හෝ අයවැය සලකා බැලීම් අවශ්‍ය වන්නේ නම්, එවැනි අවස්ථාවන්හිදී, ක්‍රියාත්මක කිරීම සහ අනුකූලතාවය හැකි තරම් ඉක්මනින් ලබා ගැනීමේ කොන්දේසිය මත, එය තාවකාලිකව කල් යැවීමේ හැකියාව ඇත;

(ii) සියලුම පළාත් පාලන ආයතන, රජයේ දෙපාර්තමේන්තු, මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන, රජයේ නියෝජිතායතන හා 1 සිට 8 තෙක් වගඋත්තරකරුවන්ගේ විෂය පථයට හෝ පාලනයට යටත් වන රජයේ සේවකයින් වෙත පහත කරුණු අවධාරණය කරමින් චක්‍රලේඛ හෝ නිර්දේශ 1 සිට 8 තෙක් වගඋත්තරකරුවන්ට සහ 1 සිට 6 තෙක් වගඋත්තරකරුවන්ගේ අමාත්‍යාංශවල ලේකම්වරුන්ට තවදුරටත් මෙයින් නිර්දේශ කරමු:

a. පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන හා පොදු සේවාවන් සපයන ස්ථාන [2006 අංක 1 දරණ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග වල 10 වන නියෝගයේ අර්ථ නිරූපණය කර ඇති ආකාරයට] ඉදිකිරීම් හා නවීකරණයන් සඳහා වන ඉදිකිරීම් සැලසුම් හා ඇඳීම් 2006 අංක 1 දරණ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග හා අනුකූල නොවන්නේ නම්, එවැනි ඉදිකිරීම් හා නවීකරණයන් සඳහා අනුමැතිය ලබා නොදෙන බව;

b. පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන හා පොදු සේවාවන් සපයන ස්ථාන [2006 අංක 1 දරණ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග වල 10 වන නියෝගයේ අර්ථ නිරූපණය කර ඇති ආකාරයට] සඳහා අනුකූලතා සහතික අදාළ ගොඩනැගිලි හා පරිශ්‍රයන් 2006 අංක 1 දරණ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග හා අනුකූල වන්නේ ද යන්න මැන බලන පරීක්ෂණයකින් අනුකූල නොවන්නේ යයි හෙළි වී නම්, එවැනි සහතික ලබා නොදෙන බව;

(iii) ඉහත (i) හා (ii) (a) හා (b) යටතේ දක්වන ලද නිර්දේශයන් පළාත් පාලන ආයතන, රජයේ දෙපාර්තමේන්තු, මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන, රජයේ නියෝජිතායතන හා 1 සිට 8 තෙක් වගඋත්තරකරුවන්ගේ විෂය පථයට හෝ පාලනයට යටත් වන රජයේ සේවකයින් විසින් ක්‍රියාත්මක කරන්නේ ද යන්න සම්බන්ධයෙන් අඛණ්ඩව හා නිතිපතා සුදුසු පසු-විපරම් ක්‍රියාමාර්ගයන් ගැනීමට 1 සිට 8 තෙක් වගඋත්තරකරුවන්ට සහ 1 සිට 6 තෙක් වගඋත්තරකරුවන්ගේ අමාත්‍යාංශවල ලේකම්වරුන්ට තවදුරටත් නිර්දේශ කරමු.

(iv) සාධාරණව සුදුසු වන අවස්ථාවන්හීදී 2006 අංක 1 දරණ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග වලට එරෙහිව සහ/හෝ එම නියෝග උල්ලංඝනය කරමින් සහ/හෝ එම නියෝග නොසලකා හරිමින් අනුමත කිරීම් සිදු කල බවට හෝ අනුකූලතා සහතික නිකුත් කල බවට හෙළි වූ රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට පළාත් පාලන ආයතන, රජයේ දෙපාර්තමේන්තු, මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන, රජයේ නියෝජිතායතන හා 1 සිට 8 තෙක් වගඋත්තරකරුවන්ගේ විෂය පථයට හෝ පාලනයට යටත් වන රජයේ සේවකයින් වෙත උපදෙස් ලබා දීමට 1 සිට 8 තෙක් වගඋත්තරකරුවන්ට සහ 1 සිට 6 තෙක් වගඋත්තරකරුවන්ගේ අමාත්‍යාංශවල ලේකම්වරුන්ට තවදුරටත් නිර්දේශ කරමු.

(v) පොදු ගොඩනැගිල්ලක්, පොදු ස්ථානයක් සහ/හෝ පොදු සේවාවන් සපයන ස්ථානයක් සම්බන්ධයෙන් සහ ඔවුන් විසින් නඩු පැවරීම උචිත යයි සළකනු ලබන අවස්තාවක දී 2006 අංක 1 දරණ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග වලට එරෙහිවීමක් සහ/හෝ එම නියෝග උල්ලංඝනය කිරීමක් සහ/හෝ එම නියෝග වලට අනුකූල වීමට අපොහොසත් වීමක් හඳුනා ගත් අවස්ථාවක දී සංශෝධිත 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 34 වන වගන්තිය ප්‍රකාරව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට පළාත් පාලන ආයතන, රජයේ දෙපාර්තමේන්තු, මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන, රජයේ නියෝජිතායතන හා 1 සිට 8 තෙක් වගඋත්තරකරුවන්ගේ විෂය පථයට හෝ පාලනයට යටත් වන රජයේ සේවකයින් වෙත මාර්ගෝපදේශ සැපයීමට 1 සිට 8 තෙක් වගඋත්තරකරුවන්ට සහ 1 සිට 6 තෙක් වගඋත්තරකරුවන්ගේ අමාත්‍යාංශවල ලේකම්වරුන්ට තවදුරටත් නිර්දේශ කරමු.

සංශෝධිත පෙත්සමේ (ඇ) සහ (ඈ) ඉල්ලීම් යටතේ යාචනය කරන ලද සහනය සම්බන්ධයෙන්:

(i) පොදු ජනයාගේ අවධානය ලබා ගැනීම සඳහා එකිනෙක අතර මාසයක කාලයක් සහිතව අවස්ථා තුනකදී ප්‍රධාන පුවත්පත්වල භාෂා තුනෙන්ම සුදුසු, ඵලදායී හා ප්‍රසිද්ධියේ පෙනෙන දැන්වීම් පළ කිරීමට ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය හා එක්ව කටයුතු කරන ආබාධ සහිත තැනැත්තන් උදෙසා වූ ජාතික සභාව වෙත මෙයින් නිර්දේශ කරමු.

a. සියලුම පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන හා පොදු සේවාවන් සපයන ස්ථාන [2006 අංක 1 දරණ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග වල 10 වන නියෝගයේ අර්ථ නිරූපණය කර ඇති ආකාරයට] 2006 අංක 1 දරණ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග වලට අනුකූල විය යුතු බව; සහ

b. ඊට අනුකූල වීමට අපොහොසත් වුවහොත් පනත යටතේ වරදක් කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු විභාගයකට යටත් විය යුතු බවත්, එම නඩු විභාගයෙන් වරදකරු කරනු ලැබුවහොත් පනතේ සඳහන් ආකාරයේ දඬුවම් වලට යටත් විය යුතු බව.

(ii) ඉහත පියවරයන්ට අමතරව සංශෝධිත 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ විධිවිධාන හා සංශෝධිත 2006 අංක 1 දරණ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග පිළිබඳ ජනතාව තුල දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා සුදුසු හා ඵලදායී මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට ආබාධ සහිත තැනැත්තන් උදෙසා වූ ජාතික ලේකම් කාර්යාලය හා එක්ව කටයුතු කරන ආබාධ සහිත තැනැත්තන් උදෙසා වූ ජාතික සභාව වෙත තවදුරටත් මෙයින් නිර්දේශ කරමු. මේ සම්බන්ධයෙන් මෙම පනතේ 13 (ඩ) වගන්තිය කෙරෙහි අප අවධානය යොමුවන අතර ඒ අනුව "*ප්‍රකාශන පළ කිරීමෙන් සහ වෙනත් වැඩපිළිවෙලවල් මඟින් ආබාධ සහිත තැනැත්තන්ගේ තත්ත්වය සහ අවශ්‍යතා පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම*" සභාවේ කාර්යයක් වශයෙන් දක්වා ඇත.

(iii) ආබාධ සහිත තැනැත්තන් උදෙසා වූ ජාතික ලේකම් කාර්යාලය හා එක්ව කටයුතු කරන ආබාධ සහිත තැනැත්තන් උදෙසා වූ ජාතික සභාව වෙත තවදුරටත් මෙයින් පහත පරිදි නිර්දේශ කරමු:

a. අදාළ නඩුවේ ස්වරූපය අනුව මහාධිකරණයට හෝ මහේස්ත්‍රාත් අධිකරණයට යොමුවීමෙන් ආබාධ සහිත තැනැත්තන්ට හා සංශෝධිත 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සහ සංශෝධිත 2006 අංක 1 දරණ

ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග යටතේ තමාගේ අයිතිවාසිකම් බලාත්මක කරගැනීමේ කැමැත්ත ඇති අන් අයට නීති උපදේශනය හා සහය වීම සඳහා පහසුකම් සැලසීම සඳහා ක්‍රියාකිරීම; සහ

b. සංශෝධිත 2006 අංක 1 දරණ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග වලට එරෙහිවීමක් සහ/හෝ එම නියෝග උල්ලංඝනය කිරීමක් සහ/හෝ එම නියෝග වලට අනුකූල වීමට අපොහොසත් වීමක් සිදු වී තිබෙන අවස්ථාවක සංශෝධිත 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව මහාධිකරණයේ නඩු පැවරීම/ නඩු පැවරීමට කටයුතු සැලැස්වීම සහ/ හෝ සංශෝධිත පනතේ 34 වන වගන්තිය ප්‍රකාරව මහේස්ත්‍රාත් අධිකරණයක ඔවුන් සාධාරණව එසේ කිරීමට උචිත යයි සලකනු ලබන අවස්ථාවක නඩු පැවරීම.

රජය විසින් රු. 50,000/- වන නඩු ගාස්තු පෙත්සම්කරු වෙත ගෙවනු ඇත.

**ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු**

ජනාධිපති නීතිඥ විජිත් මලල්ගොඩ විනිසුරු

මම එකඟ වෙමි.

**ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු**

ජනාධිපති නීතිඥ මුර්දු ප්‍රනාන්දු විනිසුරු

මම එකඟ වෙමි.

**ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු**

**පරිවර්තනය**

- **නීතිඥ D සුපුන් රෂින්ද ජයවර්ධන,** *නීතිවේදී ගෞරව (කොළඹ), නීතිපති උපාධිය (කොළඹ) ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සාමාජික.*
- **ඉසුරු මහේෂ් පණ්ඩිත**, *උපාධි අපේක්ෂක, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය.*
- **අමන්දා පාරමී කල්පශාඛා,** *උපාධි අපේක්ෂක, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය.*
- **උමේෂ් මොරමුදලි,** *ශාස්ත්‍රපති ගෞරව (කොළඹ), ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (වොරික් ලන්ඩන්) කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය, දිවුරුම් දුන් භාෂා පරිවර්තක.*

***2020/12/31** වන දින දිය.*